# ස්ත්‍රිය, කෝටාව සහ පළාත් පාලන ආයතන

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රීන් සඳහා 25% ක කෝටාව
බලාත්මක කිරීමෙන් පසුව දිස්ත්‍රික් පහක පලාත් පාලන ආයතන
නිරීක්ෂණය කිරීම පිළිබඳ වාර්තාව

Women and Media Collective
Established 1984

Norwegian Embassy
*Colombo*

# ස්ත්‍රිය, කෝටාව සහ පළාත් පාලන ආයතන

**ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රීන් සඳහා 25% ක කෝටාව බලාත්මක කිරීමෙන් පසුව දිස්ත්‍රික් පහක පලාත් පාලන ආයතන නිරීක්ෂණය කිරීම පිළිබඳ වාර්තාව**


| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | - | 2021 |
| | | කාන්තාව හා මාධ්‍ය සාමූහිකය |
| කර්තෘවරියන් | - | ක්ෂාමා රණවණ සහ සැන්ඩියා බ්‍රවුන් |
| පර්යේෂණ සහාය | - | ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය, කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, විලුදු, ගැමි කාන්තා පෙරමුණ සහ කාන්තා සහයෝගිතා පෙරමුණ. |
| සාක්ෂි කියවීම | - | තුෂාරි මඩහාපොල |
| පරිවර්තනය | - | සුරේෂ්වරන් |
| නිර්මාණ සැකැසුම | - | ප්‍රියදර්ශනී රාසයියා |
| අනුග්‍රහය | - | රාජකීය නෝර්වේජියානු තානාපති කාර්යාලය |

Norwegian Embassy
*Colombo*

ප්‍රකාශනය

**කාන්තාව හා මාධ්‍ය සාමූහිකය**



56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 08
Email: wmcsrilanka@womenandmedia.org
Web: womenandmedia.org
Facebook: https://www.facebook.com/womenandmediacollective
Twitter: https://twitter.com/womenandmedia

# පටුන


පෙරවදන....... 1
විධායක සාරාංශය....... 2
ක්‍රමවේදය....... 5
හැඳින්වීම....... 7
නිරීක්ෂකයින්ගේ සහභාගිත්වය....... 10
දිස්ත්‍රික් නිරීක්ෂණය ....... 12
කුරුණෑගල දිස්ත්‍රික්කය....... 12
ගාල්ල දිස්ත්‍රික්කය....... 14
බදුල්ල දිස්ත්‍රික්කය....... 16
නුවරඑළිය දිස්ත්‍රික්කය....... 18
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය....... 19
වෙනත් කරුණු....... 21
භාෂාව....... 21
කාර්යපටිපාටිය....... 21
කාර්ය සටහන් /වාර්තා....... 21
න්‍යාය පත්‍රය....... 21
කාලය වෙන් කිරීම....... 21
අරමුදල් සැපයීම....... 22
අධ්‍යයනයේ අඩුපාඩු ....... 23
නිර්දේශ ....... 25

# පෙරවදන

2016 වසරේදී පළාත් පාලන ආයතන සඳහා ස්ත්‍රීන්ට 25% ක පංගු ක්‍රමය (Quota) නීතිගත කිරීමේ සිට දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය වඩා අර්ථවත් කිරීම සඳහා එය ප්‍රයෝජනයට ගන්නා ආකාරය කෙසේදැයි යන්න අවබෝධ කර දීමට කාන්තාව හා මාධ්‍ය සාමූහිකය කටයුතු කර ඇත. ඓතිහාසිකව ස්ත්‍රීන් සඳහා කෝටාවේ බලපෑම වඩාත් තීව්‍ර කිරීම සඳහා වූ පර්යේෂණ, උද්දේශණ හා ධාරිතා සංවර්ධන වැඩසටහන් කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් පසුගිය වසර 3 ක කාලය තුළ ක්‍රියාවට නංවා ඇත. පළාත් සභා සහ පාර්ලිමේන්තු මට්ටමේදීත් එවන් සාධනීය විධිවිධාන ක්‍රියාත්මක කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. ස්ත්‍රීන් සඳහා වූ අනිවාර්ය කෝටාව නිසා දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස්කම් සිදු වී ඇත. එයින් එක් වැදගත් වෙනසක් නම් එතෙක් පළාත් පාලන ආයතන තුළ 100කටත් වඩා අඩුව තිබූ ස්ත්‍රී නියෝජනය, 2018 පළාත් පාලන මැතිවරණයෙන් අනතුරුව එය 2000 කට ආසන්න සංඛ්‍යාවක් දක්වා වර්ධනය වී තිබීමයි.

කුරුණෑගල, ගාල්ල, බදුල්ල, නුවරඑළිය සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 5 තුළ තෝරා ගත් පළාත් පාලන ආයතන 25ක සභා රැස්වීම්වල කටයුතු පිළිබඳ නිරීක්ෂණයන් මෙම අධ්‍යයනයට පාදක වී ඇත. එහිදී පළාත් පාලන ආයතන සභිකවරියක ලෙස සිය වගකීම් දරණ ආකාරය, සිය වගකීම් ඉටු කිරීමේදී ඔවුන් කෙතරම් දුරකට සාර්ථකව එය ඉටු කළාද යන්න සහ මෙම ක්‍රියාවලිය තුළ ඔවුන් මුහුණ දුන් අභියෝග සහ ඒවා ජය ගැනීමට ඇති වූ බාධක හඳුනා ගැනීම සඳහා කාන්තාව හා මාධ්‍ය සාමූහිකය, හවුල්කාර සංවිධාන පහක් සමග එක්ව මෙම නිරීක්ෂණ ක්‍රියාවලිය සිදුකරන ලදී. 2018 නොවැම්බර් මස සිට 2019 දෙසැම්බර් මස දක්වා කාලය තුළ කරන ලද මෙම පර්යේෂණය, පළාත් පාලන ආයතන නිරීක්ෂණය කළ ස්ත්‍රී සංවිධාන 5 හි දෘෂ්ටිකෝණයෙන් සිදුකර ඇත. එම සොයාගැනීම් අනුව සභා රැස්වීම් තුළ සභිකවරියන්ගේ ක්‍රියාකාරිත්වය, සභිකවරියන් පිළිබඳව පුරුෂයින්ගේ දැක්ම, පුහුණුවේ වැදගත්කම හා අදාලත්වය, භාෂාව, ක්‍රමවේදය, කාලය වෙන් කිරීම, ස්ත්‍රීන්ගේ ගැටළු වලට ඇති සංවේදීතාවය සහ අරමුදල් සැපයීම යන කරුණු පිළිබඳව දළ විස්තරයක් ද මෙහි දක්වා ඇත. එසේම අප විසින් අධ්‍යයනයේ දී හඳුනාගත් තොරතුරු මත පදනම්ව දේශපාලන පක්ෂ, සමාජ සංවිධාන සහ මාධ්‍ය වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මාලාවක් ද මෙම වාර්තාව තුළ අන්තර්ගතය.

මෙම නිරීක්ෂණ වාර්තාව සම්පාදනය කිරීම සහ එය ලිවීම පිළිබඳව අප කෂ්මා රණවන මහත්මියට ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු. එසේම මෙම අධ්‍යයනය වඩාත් සාර්ථකව කරගෙන යාමට එක් එක් දිස්ත්‍රික්කවල නිරීක්ෂණ කණ්ඩායම් වලට නායකත්වය සැපයූ ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානයේ සුමිකා පෙරේරා, කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ චන්ද්‍රා වෙදගෙදර, ගාල්ල ගැමි කාන්තා පෙරමුණේ ශ්‍රියාණි පතිරගේ, විලුදු සංවිධානයේ මෛත්‍රී රාජසිංහම් හා එච්. ඉන්තුමතී සහ කාන්තා සහයෝගීතා පෙරමුණේ පොන්නයියා ලෝගේස්වරී යන මහත්මීන්ට අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු. පර්යේෂණය යථාර්ථයක් බවට පත් කළ කුමුදනී සැමුවෙල් මහත්මියටත්, වටිනා සහයෝගයක් ලබාදුන් වයලා පෙරේරා සහ තරංගා ද සිල්වා යන මහත්මීන්ටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමු. සිය වටිනා අදහස් සහ අරමුදල් සැපයීම වෙනුවෙන් රාජකීය නෝර්වේජියානු තානාපති කාර්යාලයේ මොනිකා ස්වෙන්ස්කෙරුඩ් සහ සුන්දරී ජයසූරිය යන මහත්මීන් මෙහිලා ස්තුති පූර්වකව මතක් කරමු. ඔවුන්ගේ සහාය නොලැබුණි නම් මෙම පර්යේෂණය ඔබ වෙතට පත් නොවන්නට ඉඩ තිබුණි.

**සන්ච්යා බ්‍රවුන්**
*වැඩසටහන් නිලධාරිනී,*
*කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය,*
*2021 පෙබරවාරි.*

# විධායක සාරාංශය

2018 වසරේ පෙබරවාරි මස පැවති පළාත් පාලන මැතිවරණයේ විශේෂ ලක්ෂණ දෙකක් විය. මිශ්‍ර සභික සමානුපාතික ක්‍රමයක් වෙත ගමන් කිරීම සහ 25% ක ස්ත්‍රී නියෝජනය තහවුරු කිරීම පිණිස වූ නෛතික බැඳීමක් සහිත පංගුව (Quota) හඳුන්වා දීම, මිශ්‍ර සභික සමානුපාතික ක්‍රමය යටතේ ආසන වලින් 60% ක් කොට්ඨාශ වලින් සමන්විත වූ අතර කේවල ක්‍රමය යටතේ එම ආසන සඳහා තරඟ කිරීමට නාමයෝජනා වලින් අවම වශයෙන් 10%ක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලදී. ආසන්න වශයෙන් 537 ක් පළාත් පාලන ආයතනවල ආසන සඳහා සුදුසුකම් ලබා ඇති දේශපාලන පක්ෂ විසින් ලබාගත් ඡන්දවලට සමානුපාතික ලෙස ආසන්න වශයෙන් 1454 ක සංඛ්‍යාවක් වන ඉතිරි පත්වීම් සංඛ්‍යාව සිදු කරනු ලබන අතිරේක පුද්ගල ලැයිස්තුවෙන් 50%ක් ස්ත්‍රීන්ගෙන් සමන්විත විය. සෑම සභාවකම නියෝජිතයන්ගෙන් 25%ක් ස්ත්‍රීන් වන බවට වගබලා ගැනීමේ වගකීම මැතිවරණ කොමිෂන් සභාව වෙත පවරන ලදී. මෙම දෙවන කරුණ, තීරණ ගැනීමේ මට්ටමේ ස්ත්‍රීන් සඳහා සාධාරණ නියෝජනයක් වෙනුවෙන් බොහෝ කලක සිට දැඩි වෙහෙසක් දරමින් ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ උද්දේශන කටයුතු කරන පුද්ගලයන් සහ ක්‍රියාකාරීනියන් ලබාගත් විශාල ජයග්‍රහණයක් විය.

දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය ඉහළ දැමීම වෙනුවෙන් කාන්තාව හා මාධ්‍ය සාමූහිකය සිය විධිමත් උද්දේශන කටයුතු ආරම්භ කරන ලද්දේ 2001 වසරේදී ය. 2016 සහ 2017 මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී ස්ත්‍රීන් වෙනුවෙන් කෝටාවක් වෙන් කිරීම සම්බන්ධයෙන් ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළේය. එයින් නොනැවතුණු කාන්තාව හා මාධ්‍ය සාමූහිකය එම කෝටාව යථාර්ථයක් බවට පත්වන තුරුම එනම් 2018 පළාත් පාලන මැතිවරණය පැවැත්වෙන තුරු එය පසුවිපරමට ලක් කරමින් අලුතෙන් තේරී පත් වූ සභිකවරියන්ගේ වැඩකටයුතු, තෝරා ගත් පළාත් පාලන ආයතන කිහිපයක් තුළ නිරීක්ෂණයට ලක් කරන ලදී.

''ආකල්පමය වෙනසක් සඳහා : දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය ඉහළ දැමීම සඳහා අන්තර්කරණ රාජ්‍ය පාලනය හා සුභවාදී ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම'' යන වැඩසටහනෙහි කොටසක් වන මෙම අධ්‍යයනය බාරගනු ලැබුවේ පංගු ක්‍රමය හඳුන්වා දුන් පසු පළාත් පාලන ආයතන තුළ සභිකවරියන් ලෙස කටයුතු කිරීමේදී ඔවුන් අත්පත් කර ගනු ලබන සාර්ථකත්වයන් මෙන්ම ඔවුන් මුහුණ දෙනු ලබන අභියෝගයන් අවබෝධ කර ගැනීම සඳහා ය.

ඉහත දැක් වූ කරුණු දෙක යටතේ පැවති පළාත් පාලන මැතිවරණයේ දී එක් වරම පළාත් පාලන ආයතන සභිකයින්ගේ සංඛ්‍යාව ගැහැණු - පිරිමි දෙපාර්ශවයම හදිසියේම විශාල ලෙස පුළුල් විය. මෙමගින් පළාත් පාලන ආයතන 341 සඳහාම ස්ත්‍රීන් පත් වූ අතර එතෙක් 100ට අඩු නියෝජනයක් වූ ස්ත්‍රී සභික සංඛ්‍යාව 2000 ක් දක්වා ඉහළ ගියේය. සැලකිය යුතු ලෙස වැඩිපුර ප්‍රතිපාද ලබාදෙන තෙක් සීමා සහිත භෞතික ඉඩකඩ තුළ සියලුදෙනා හට ඉඩපහසුකම් සපයාදීම සහ සීමාසහිත මූල්‍ය සහ ද්‍රව්‍යමය සම්පත් සහිතව වැඩකටයුතු කිරීම සඳහා යුහුසුලුව තක්කාලින සැලකසුම් සකස්කිරීමට බොහෝ පළාත් පාලන ආයතනවලට සිදුවිය.

දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය ශක්තිමත් කිරීම සඳහා දිගු කාලයක සිට ඉතා සක්‍රීයව කටයුතු කරමින් සිටින කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් තෝරාගත් ස්ත්‍රී හවුල්කාර සංවිධාන සමග එක්ව 2018 නොවැම්බර් මස සිට 2019 දෙසැම්බර් මස දක්වා කාලය තුළ මෙම නිරීක්ෂණය සිදු කරන ලදී. කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය - බදුල්ල, කාන්තා සහයෝගිතා පෙරමුණ - නුවරඑළිය, ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය - කුරුණෑගල, විලුදු- ත්‍රිකුණාමලය සහ ගැමි කාන්තා පෙරමුණ - ගාල්ල එම සංවිධාන වේ. එම දිස්ත්‍රික් පහෙන් තොරාගත් පළාත් පාලන ආයතන 25ක සභා රැස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා එම ප්‍රාදේශීය සංවිධානවලින් නිරීක්ෂිකාවන් සම්බන්ධ කරගන්නා ලදී.

සමස්තයක් ලෙස, සභිකවරියන් මුල් අවස්ථාවේ සභා කටයුතුවලට පූර්ණ ලෙස සම්බන්ධ නොවී නිහඬව සිටි බවක් අධ්‍යයනයේ මුල් අවස්ථාවේ දී අනාවරණය විය. සභා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දැනුම සමග ස්වකීය ඡන්ද කොට්ඨාශවල අභිලාෂයන් වඩා හොඳින් නියෝජනය කිරීම පිණිස පළාත් ආයතනයේ කටයුතු තුළ වඩා සක්‍රීය ලෙස නියෝග දීම සඳහා අවශ්‍ය විශ්වාසය ඔවුන් විසින් ලබාගන්නා ලදී.

එසේ වුවත්, කාලය ගත වීමත් සහ පුහුණු වැඩසටහන්වලට සම්බන්ධව වීමත් සමඟ වඩා සක්‍රිය ලෙස පළාත් පාලන ආයතන තුළ තම මැතිවරණ බල ප්‍රදේශ වල නියෝජිතවරියන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය විශ්වාසය ඔවුහු දිනා ගත්හ.

සභාවල සභිකවරුන් සහ විශේෂයෙන් සභාපතිවරුන් අතර, සභිකවරියන් හෑල්ලුවට ලක් කරන ආකාරයක් සහ සභා කටයුතු වලදී සමාන හවුල්කරුවන් ලෙස සැලකීමට බරපතල අකමැත්තක් පවතින බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය. නිරීක්ෂණයට ලක් කරන ලද සියළු පළාත් පාලන ආයතන තුළ මූල්‍ය සම්පත් සමාන ලෙස ස්ත්‍රීන්ට බෙදී නොයාම සහ සිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් නොලැබීම හෝ කිසිසේත්ම මුදල් නොලැබීම යන කරුණු දක්නට ලැබුණි.

සභා කටයුතු පුරුෂයින්ගේ ආධිපත්‍යයට යටත්ව පවතින අතර පුරුෂයින් බොහෝ වේලාවට ස්ත්‍රීන්ට වඩා වැඩි කාලයක් ලබා ගනී. එසේම සභිකවරියන් සිය මැදිහත්වීම් සිදු කරන විට ඒවා කඩාකප්පල් කිරීමට සභිකවරුන් කටයුතු කරන අතර බොහෝ විට දේශපාලනය තුළ ස්ත්‍රී ප්‍රතිරූපය දියාරු කිරීමට උත්සාහ දරයි. දේශපාලනය තුළ ස්ත්‍රීන් සම්බන්ධ වී සිටීම පිළිබඳව බොහෝ පිරිමින් ඉතා සෘණාත්මක ආකල්පයක් දරන අතර ස්ත්‍රීන් සඳහා වූ අනිවාර්ය 25% කෝටාව නිසා පුරුෂයන්ට දේශපාලනය තුළ හිමිව තිබූ තැන අහිමිව ගොස් ඇතැයි යන මතය ඔවුන්ගේ සිත් තුළ මුල්බැසගෙන ඇත.

සභාවේ කාරක සභාවලට සභිකවරියන් පත් කිරීම ඉතා අවම මට්ටමක පවතින අතර තාක්ෂණික හා මූල්‍ය කාරක සභා වෙත පත්වීම් සිදු කිරීමේදී බොහෝ විට ස්ත්‍රීන් නොසලකා හැරීමට ලක් වේ. සමස්තයක් ලෙස ගත් කළ, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදීතාවය ඉහළ නැංවීමට සභා තුළ ඇති කැපවීම ප්‍රමාණවත් නොවන අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන්ද හඳුන්වා දීමක් සිදුනොවේ. තවමත් ස්ත්‍රීන්ගේ භූමිකාව ලෙස දකින්නේ ආගමික හා සංස්කෘතික රාමු තුළ පමණක් වන අතර ස්ත්‍රීන්ගේ විෂය පථයට අයත් වැඩ ලෙස සලකනු ලබන ඉවුම් පිහුම් කටයුතු, පෙර පාසල් ගුරුවරියන් ලෙස කටයුතු කිරීම සහ ඇඳුම් මැසීම වැනි ඒකාකෘති ක්‍රියාකාරම් සඳහා පක්ෂග්‍රාහී වේ.

2017 අංක 16 දරණ පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත, සභාවේ කාර්යයන්වලට අදාල ගැසට් නිවේදන සහ පළාත් පාලන ආයතනවල කාර්යයන් පිළිබඳ දැනුම සභිකවරියන් තුළ පමණක් නොව සභිකවරුන් තුළද අල්ප බවද හඳුනා ගෙන ඇති කාරණයකි. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ස්ත්‍රීන් තුළ උනන්දුවක් පැවතියද, ඔවුනට ප්‍රමාණවත් මාධ්‍ය ආවරණයක් නොලැබෙන නිසා එමගින් සභිකවරියන් මැතිවරණ කොට්ඨාශ වලට යහපත් දායකත්වයක් ලබා නොදෙන බවට මතයක් නිර්මාණය කරයි. සමාජ මාධ්‍ය මෙවලම් භාවිතා කිරීම සම්බන්ධයෙන් ඔවුන් තුළ පවතින දැනුම අල්ප වීම මෙම තත්ත්වය තවත් සංකීර්ණ බවට පත් කරයි.

විශේෂයෙන් පළමු වතාවට සභිකවරියන් ලෙස තේරී පත් වූ ස්ත්‍රීන් මුහුණ දෙනු ලබන අභියෝගයන් සහ තීරණ ගැනීමේ මට්ටමේදී වඩා යහපත් ස්ත්‍රී නියෝජනයක් තහවුරු කිරීම සඳහා කෝටාව පමණක් ප්‍රමාණවත් නොවන බව මෙම අධ්‍යයනය විසින් අවධාරණයට ලක් කරනු ලබයි. කෝටාව ආරක්ෂා කිරීම සඳහා දේශපාලන වුවමනාව අවශ්‍ය කරන අතර මෙම අයිතිය ආරක්ෂා කිරීම සහ අනෙකුත් පාලන මට්ටම්වලට ඒ හා සමාන විධිවිධාන හඳුන්වා දීම සඳහා දේශපාලන පක්ෂ, ප්‍රජා සංවිධාන මෙන්ම මාධ්‍යයද එක්ව කටයුතු කළ යුතුය.

සභිකවරියන්ට සිය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා මූල්‍යමය ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු නොකරන හෝ සීමාසහිත ප්‍රතිපාදන වෙන්කිරීම් පොදුවේ නිරීක්ෂණය කරන ලද කරුණක් විය. විශේෂයෙන් විරුද්ධ පක්ෂ නියෝජනය කරනු ලබන සභිකයින් මෙම තත්ත්වයට මුහුණ දෙයි. එසේම දේශපාලන පක්ෂ

හරහා සපයාදෙනු ලබන අරමුදල් වලින් ස්ත්‍රීන්ගේ සංවර්ධන කටයුතු සඳහා ලබාදෙනු ලබන්නේ සීමිත සම්පත් ප්‍රමාණයකි. 2018 මාර්තු සිට ඇතැම් සභිකවරියන් දේශපාලන පක්ෂ වෙතින් කිසිදු මූල්‍ය ප්‍රතිපාදනයක් ලබා නොමැති බව නිරීක්ෂිකාවෝ සඳහන් කරති. සභිකවරියන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා සහා රැස්වීම් වාර්තා තුළට ඇතුළත් නොවන අවස්ථා තිබෙන අතර සංශෝධනයන් සිදුකරනු ලබන විට දී පවා ඒවා වාර්තා තුළට ඇතුළත් කරනු ලබන්නේ නැත. ස්වකීය යෝජනා පිළිගෙන ක්‍රියාවට නැංවීමෙහිලා සභිකවරියන් විවිධ අභියෝගවලට මුහුණ දෙන බව පැහැදිලි කරුණකි.

# ක්‍රමවේදය

අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද දිස්ත්‍රික්ක පහ වූයේ, ගාල්ල, කුරුණෑගල, බදුල්ල, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය. අධ්‍යයනය සඳහා කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් අදාල දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක ස්ත්‍රී සංවිධාන සම්බන්ධ කර ගන්නා ලදී. තෝරා ගන්නා ලද කාලසීමාව තුළ තෝරා ගනු ලැබූ සභාවන්හි රැස්වීම්වලට සහභාගි වීම සඳහා එම සංවිධාන වලින් ස්ත්‍රීන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු යොදවනු ලැබූ අතර ඔවුන්ගේ කාර්යභාරය වූයේ සභාවේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම, සපයන ලද දායකත්වයන් නිරීක්ෂණය කිරීම, එම සභාවලට තේරී පත් වූ සභිකවරියන් මුහුණ දෙනු ලබන අභියෝග අවබෝධ කර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදීතාවයට ඇති කැපවීම තේරුම් ගැනීමයි. අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ සභාවන් කිහිපයක් මහ නගර සභා සහ නගර සභා වූ අතර බහුතරය වූයේ ප්‍රාදේශීය සභාය. පළාත් පාලන ආයතන වල පරිපාලන කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ කොමසාරිස්වරයෙකු නිසා නිරීක්ෂිකාවන් ලෙස සභා කටයුතු වලට සහභාගි වීම සඳහා පාර්ශ්ව සංවිධාන විසින් පළමුව කොමසාරිස්වරුන්ගේ අවසරය ලබා ගන්නා ලදී.

**නිරීක්ෂණය කරන ලද සභාවල, එක් එක් සභාවේ මුළු සභික සංඛ්‍යාව, සභිකවරියන් සංඛ්‍යාව සහ නිරීක්ෂිකාවන් සංඛ්‍යාව පිළිබඳ විස්තර**

| ගාල්ල දිස්ත්‍රික්කය | මුලු සභික සංඛ්‍යාව | සභිකවරියන් සංඛ්‍යාව | නිරීක්ෂිකාවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ගාල්ල මහ නගර සභාව | 33 | 8 | 2 |
| හික්කඩුව ප්‍රාදේශීය සභාව | 21 | 5 | 3 |
| බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව | 22 | 5 | 2 |
| අක්මීමන ප්‍රාදේශීය සභාව | 28 | 8 | 2 |
| බද්දේගම ප්‍රාදේශීය සභාව | 34 | 7 | 2 |
| නිරීක්ෂණ සංවිධානය - ගැමි කාන්තා පෙරමුණ | | | |

| කුරුණෑගල දිස්ත්‍රික්කය | මුලු සභික සංඛ්‍යාව | සභිකවරියන් සංඛ්‍යාව | නිරීක්ෂිකාවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| කුරුණෑගල මහ නගර සභාව | 21 | 6 | 3 |
| ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව | 43 | 10 | 3 |
| කුරුණෑගල ප්‍රාදේශීය සභාව | 34 | 8 | 2 |
| පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව | 39 | 9 | 3 |
| රිදීගම ප්‍රාදේශීය සභාව | 29 | 6 | 2 |
| නිරීක්ෂණ සංවිධානය - ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය | | | |

| බදුල්ල දිස්ත්‍රික්කය | මුලු සභික සංඛ්‍යාව | සභිකවරියන් සංඛ්‍යාව | නිරීක්ෂිකාවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| බදුල්ල මහ නගර සභාව | 25 | 6 | 2 |
| සොරණාතොට ප්‍රාදේශීය සභාව | 16 | 4 | 2 |
| හාලිඇල ප්‍රාදේශීය සභාව | 40 | 10 | 2 |
| පස්සර ප්‍රාදේශීය සභාව | 23 | 5 | 2 |
| බදුල්ල ප්‍රාදේශීය සභාව | 16 | 6 | 2 |
| නිරීක්ෂණ සංවිධානය - කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය | | | |

| නුවරඑළිය දිස්ත්‍රික්කය | මුලු සභික සංඛ්‍යාව | සභිකවරියන් සංඛ්‍යාව | නිරීක්ෂිකාවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| හැටන් දික්ඔය ප්‍රාදේශීය සභාව | 16 | 4 | 2 |
| මස්කෙලිය ප්‍රාදේශීය සභාව | 16 | | 1 |
| නෝවුඩ් ප්‍රාදේශීය සභාව | 21 | 6 | 1 |
| අඹගමුව ප්‍රාදේශීය සභාව | 21 | 5 | 1 |
| කොටගල ප්‍රාදේශීය සභාව | 16 | 4 | 2 |
| නිරීක්ෂණ සංවිධානය - කාන්තා සහයෝගිතා පෙරමුණ | | | |

| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | මුලු සභික සංඛ්‍යාව | සභිකවරියන් සංඛ්‍යාව | නිරීක්ෂිකාවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| උප්පුවේලි ප්‍රාදේශීය සභාව | 17 | 5 | 3 |
| මුතූර් ප්‍රාදේශීය සභාව | 24 | 3 | 4 |
| කින්නියා ප්‍රාදේශීය සභාව | 16 | සඳහන්ව නැත | 3 |
| කින්නියා නගර සභාව | 13 | සඳහන්ව නැත | 3 |
| ත්‍රිකුණාමලය නගර සභාව | 24 | 6 | 4 |
| නිරීක්ෂණ සංවිධානය - විලුදු | | | |

# හැඳින්වීම

සමානාත්මතාවය සඳහා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, ප්‍රතිපත්තිමය බැඳීම්, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන තුළ ඇතුලත් පොරොන්දු හා ජාත්‍යන්තර බැඳීම් තිබුණද, ශ්‍රී ලාංකීය දේශපාලනය තුළ අඩු ස්ත්‍රී නියෝජනය තවමත් නොවිසඳුනු ගැටලුවක්ව පවතී. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 6% කට අඩුව පැවති අතර තවමත් එය ඉන් ඔබ්බට ගමන් කොට නැත. පළාත් සභා තුළ එය 4% ක් වන අතර වසර ගණනාවක් වන තුරු පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය 2%කට[1], අඩු මට්ටමක පැවතුණි. කෙසේ වෙතත් දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය ඉහළ දැමීම සඳහා ස්ත්‍රී සංවිධාන සහ ක්‍රියාකාරිනියන් විසින් දශක ගණනාවක් තිස්සේ සිදු කරන ලද අඛණ්ඩ අරගලවල ප්‍රතිඵලයක් ලෙස පළාත් පාලන ආයතන සඳහා ස්ත්‍රීන් සඳහා 25%[2] ක කෝටාව බලාත්මක විය. එම ක්‍රමය යටතේ මුල් වරට පළාත් පාලන මැතිවරණය පැවැත්වුණේ 2018 වසරේදීය. 2017 අංක 16 දරණ පලාත් පාලන මැතිවරණ (සංශෝධන) පනතට සංශෝධන ගෙන ඒමේ කටයුත්තේ ඉදිරියෙන්ම සිටියේ කාන්තාව හා මාධ්‍ය සාමූහිකය වන අතර එම සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය අවම වශයෙන් 25% ක් දක්වා ඉහළ ගියේය.

පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන තුළ නීතිමය බැඳීමක් සහිත පංගු ක්‍රමයේ සුභවාදී ක්‍රියාකාරකම් වෙනුවෙන් උද්දේශන කටයුතු සිදු කිරීම, වසර 20කට අධික කාලයක් තිස්සේ දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය සහ සහභාගිත්වය ඉහළ දැමීම සඳහා කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් යොදා ගන්නා ලද මූලෝපායයන් අතුරින් එකකි. සමාන නියෝජනය සඳහා ප්‍රමිතීන් යෝජනා කරමින් සහ මැතිවරණ ප්‍රතිසංස්කරණයන් පිලිබඳ සාකච්ඡාවලට සම්බන්ධ වෙමින් 2016 වසරේදී ආරම්භ කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අප විසින් දක්වන ලද දායකත්වය, රාජ්‍ය පාලනයේ සියලු මට්ටම්වලදී ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීමට අත්‍යවශ්‍යය සංවිධානයක් ලෙස අනිවාර්ය නීතිමය ක්‍රියාමාර්ග යෝජනා කිරීමට අමතරව සිය දේශපාලන පක්ෂ තුළ තීරණ ගැනීමේ මට්ටම් වලට ස්ත්‍රීන් ගෙන එන ලෙස කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් දේශපාලන පක්ෂ වලට ආරාධනා කරන ලද අතර, ස්ත්‍රීන් මැතිවරණවලදී නායකත්වය සහ තීරණ ගැනීම සඳහා පුහුණු කිරීමට සහ සූදානම් කිරීමට ප්‍රාදේශීය ස්ත්‍රී සිවිල් සමාජ සංවිධාන සහ දේශපාලනය තුළ නිරත වී සිටින ස්ත්‍රීන් සමග එක්ව කටයුතු කළාය. නිදහස් හා සාධාරණ මැතිවරණ, ප්‍රචණ්ඩත්වයෙන් තොර මැතිවරණ සහ ස්ත්‍රීන්ට ඡන්ද ලබා දීම වෙනුවෙන් සියළු පක්ෂ සමග එක්ව කටයුතු කළේය. දේශපාලන පක්ෂ විසින් ස්ත්‍රීන්ට නාම යෝජනා ලබා නොදුන් විටදී, ස්ත්‍රීන් වෙනුවෙන් ස්වාධීන නාම යෝජනා පත්‍ර සකස් කිරීමට කාන්තාව හා මාධ්‍ය සාමූහිකය ස්ත්‍රීන්ට සහාය ලබා දී ඇත. පළාත් පාලන ආයතනවල වැඩ කටයුතු අධීක්ෂණය කිරීමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදී වැඩසටහන් හා අයවැය සකස් කිරීම සඳහා ප්‍රාදේශීය ස්ත්‍රී සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ඒවා මොනිටර් කරමින් දේශපාලනය තුළ වගකීම් ප්‍රවර්ධනය කොට ඇත. එසේම අපේක්ෂිකාවන්ගේ තොරතුරු ලේඛනගත කරමින් සහ විවිධ මාධ්‍ය හා වෙනත් මැදිහත්වීම් කරමින් ස්ත්‍රීන් සඳහා ඡන්දය භාවිතා කරන ලෙස ඉල්ලීම් සිදු කරමින් ඡන්ද දායකයන් දැනුවත් කිරීමේ වැඩ කටයුතු සිදු කොට ඇත. අභිනවයෙන් පත් වූ පළාත් පාලන සභිකවරියන්ගේ ධාරිතා වර්ධනය කිරීම සඳහා කාන්තාව හා මාධ්‍ය සාමූහිකය අඛණ්ඩව කටයුතු කරමින් සිටින අතර පාර්ලිමේන්තුව සහ පළාත් සභා තුළ ස්ත්‍රී නියෝජනය ඉහළ දැමීමේ සුභවාදී අවශ්‍යතාවය වෙනුවෙන් මහජන කතිකාවක් ඇති කිරීම වෙනුවෙන් ද කැප වී කටයුතු කරමින් සිටී.

පර්යේෂණයට අනුව, දේශපාලන ආයතන තුළ ස්ත්‍රීන්ගේ අඩු නියෝජනයට සහ සහභාගිත්වයට බලපාන්නා වූ අභියෝග සහ මූලහේතු ගණනාවක් තිබේ. දේශපාලන පක්ෂ මට්ටමින්, මැතිවරණ ක්‍රම මට්ටමින්, පෞද්ගලික මට්ටමින් සහ මැතිවරණ කොට්ඨාශ මට්ටමින් වශයෙන් මූලික බාධාවන් හතරක් හඳුනාගෙන

[1]https://www.lk.undp.org/content/srilanka/en/home/library/democratic_governance/the-struggle-for-equal-political-representation-of-women-in-sri-.html
[2]https://groundviews.org/2018/02/07/the-significance-of-the-25-quota-for-women-in-local-government/

ඇත. (කොඩිකාර 2009, ලියනගේ 2005, සැමුවෙල් 2000) මෙම කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සංවිධාන කිහිපයෙන් පළමු එක වන්නේ කාන්තාව හා මාධ්‍ය සාමූහික යයි. එහි මූලාරම්භය ඇරඹුනේ 2007 වසරේදීය. පළාත් පාලනය පිළිබඳව ස්ත්‍රීන්ගේ දැනුම ඉහළ දැමීම, පළාත් පාලන මැතිවරණ සඳහා තරඟ කිරීමට ඔවුන්ගේ ධාරිතාවයන් ගොඩ නැගීම සහ යහපාලනය ඇති කිරීමට ඔවුන් හට සහාය වීමේ අරමුණ ඇතිව ස්ත්‍රීන් 25 දෙනෙකු විසින් දිස්ත්‍රික් 3 ක පලාත් පාලන ආයතන 14 ක් නිරීක්ෂණය කරන ලදී. බදුල්ල, මොණරාගල, සහ කුරුණෑගල යන දිස්ත්‍රික් තුළ ක්‍රියාත්මක වූ ස්ත්‍රී සංවිධාන විසින් එම නිරීක්ෂණයන් සිදු කරන ලදී. තෝරා ගත් පළාත් පාලන ආයතනවල මාසික රැස්වීම් වලට සහභාගි වූ නිරීක්ෂණ කණ්ඩායම් විසින් පළාත් පාලන ක්‍රියාවලිය නිරීක්ෂණය කරන ලදී. නිරීක්‍ෂණයේ සොයා ගැනීම් පිළිබඳ මැතිවරණ ප්‍රතිසංස්කරණය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන මහතා සමග කරන ලද සාකච්ඡාවෙන් අනතුරුව නිරීක්‍ෂණ වාර්තාවේ කොටසක් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වාර්තාවක් නිරීක්ෂණයේ සොයා ගැනීම් ලෙස 2007 වසරේ ජුනි මාසයේදී ඉදිරිපත් කරන ලදී.

ගොඩනගා ගත් මෙම අත්දැකීම් මත කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් 2018 නොවැම්බර් මස සිට 2019 දෙසැම්බර් මස දක්වා කාලය තුළ පළාත් පාලන ආයතන වල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම සඳහා වූ මෙම වැඩසටහන තෝරා ගත් දිස්ත්‍රික් පහක එක් එක් දිස්ත්‍රික්කයක, එක් එක් ස්ත්‍රී සංවිධානයක් හරහා ක්‍රියාත්මක කරන ලදී. නිරීක්‍ෂණයට සම්බන්ධ වූ දිස්ත්‍රික් ස්ත්‍රී සංවිධාන වූයේ ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය - කුරුණෑගල, කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය - බදුල්ල, ගැමි කාන්තා පෙරමුණ - ගාල්ල, විලුදු - ත්‍රිකුණාමලය සහ කාන්තා සහයෝගීතා පෙරමුණ නුවරඑළියයි. පළාත් පාලන ආයතන සභා රැස්වීම් ක්‍රියාවලිය නිරීක්‍ෂණය කරන ආකාරය, නිරීක්‍ෂණයට භාජනය වූ තොරතුරු සංක්ෂිප්තව මාසික වාර්තාවක් ලෙස සම්පාදනය කරන ආකාරය පිළිබඳව නිරීක්ෂිකාවන් පුහුණු කරන ලදී. සකස් කරන ලද වාර්තා සමාලෝචනය කරමින්, එම සමාලෝචනයන් මත පදනම් වූ මූලෝපායික ක්‍රියාකාරකම් සිදු කරන ලදී. පළාත් පාලන ආයතන වලට තේරී පත් වූ සභිකවරියන් (විශේෂයෙන් පසුගිය වසර කිහිපය තුළ කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් පුහුණු කරන ලද ස්ත්‍රීන්) ක්‍රියා කරන ආකාරය පිළිබඳ අදහස් විශාල ප්‍රමාණයක් නිරීක්ෂණයෙන් ලබා ගත හැකි විය.

නිරීක්ෂිකාවන්ගේ අත්දැකීම් වලට අමතරව 2019 මැයි සහ ජුනි මාස වලදී කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් සිය හවුල්කාර සංවිධාන සමග එක්ව බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය සභාවේ සහ ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කරන ලදී. එම නිරීක්ෂණයන් හරහා අපට වැදගත් තොරතුරු බොහොමයක් ලබා ගැනීමට හැකි වූ අතර ඉදිරියේදී පළාත් පාලන ආයතන වල සභිකවරියන් සඳහා පුහුණු කටයුතු සැලසුම් කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ දැනුමක්ද ලබාගත හැකිවිය. පළාත් පාලන ආයතනවල රැස්වීම් ඉතා දැඩි මාර්ගෝපදේශයක් යටතේ පැවැත්වුවත්, ඇතැම් අවස්ථාවලදී එම මාර්ගෝපදේශයන් නිසි ලෙස පිළිපදින්නේ නැත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව මාර්ගෝපදේශයන් සභා තුළ දක්නට නොවූ අතර සභා රැස්වීම් තුලදී එය අනුගමනය කරනු ලබන විධිමත් ආකාරයක් නිරීක්ෂණය නොවුනි. අභිනවයෙන් සභාවන්ට තේරී පත් වූ සභිකවරියන්ට සිය කටයුතු සාධාරණ අන්දමින් ඉටු කිරීමට මෙය බාධාවකි. නිරීක්ෂිකාවන්ට යම් යම් අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ බවද සඳහන් කළ යුතුය. උදාහරණයක් ලෙස ඇතැම් සභා ගර්භයන් තුළ නිරීක්ෂිකාවන්ට නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට අවසර ලබා නොදුන් අතර ඇතැම් ඒවා නිවැරදි සභා රැස්වීම් දින ලබා දී නොතිබුණි. අනෙකුත් අභියෝගයන් වූයේ නිරීක්ෂණ කටයුතු සඳහා පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ (පුටු ආදී) සටහන් තබා ගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමයි.

## නිරීක්ෂණ අධ්‍යයනය

පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දුන් 25% අනිවාර්ය පංගු ක්‍රමය හරහා අභිනවයෙන් පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ සභිකවරියන්ගේ අත්දැකීම් උකහා ගැනීම සඳහා වූ මෙම අධ්‍යයනය සම්බන්ධීකරණය සහ ලේඛනගත කිරීම් සිදු කරන ලද්දේ කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසිනි. පළාත් පාලන ආයතන ක්‍රියාකාරකම් තුළ කැපවීමෙන් කටයුතු කිරීම හරහා සිය මැතිවරණ කොට්ඨාශ වෙත සේවාවන් සැපයීමට සභිකවරියන් (විශේෂයෙන් පළමු වතාවට තේරී පත් වූ සභිකවරියන්) දක්වන උනන්දුව කොතරම්දැයි අවබෝධ කර ගැනීමට මෙම අධ්‍යයනය අපට ඉවහල් විය. දිස්ත්‍රික්ක පහ තුළ පාර්ශ්වකාර සංවිධාන විසින් සිදු කරන ලද නිරීක්ෂණයන්ගේ පූර්ණ වාර්තාවක් ලෙස මෙම අධ්‍යයනය හැඳින්විය හැකිය. නිරීක්ෂණය කරන ලද එක් එක් දිස්ත්‍රික්කය තුළ පළාත් පාලන ආයතන තුළ සිදු කරන ලද නිරීක්ෂණයන්ගේ සවිස්තරාත්මක වාර්තාවක් මෙම අධ්‍යයනයට අමුණා ඇත.

පළාත් පාලන සභිකවරියන් පළාත් පාලන ආයතනවල රැස්වීම් වලට අනුගත වන්නේ කෙසේද, ඔවුන් විසින් කරන ලද යෝජනා, අරමුදල් ලැබීම, සභාවේ කාරක සභා තුළ ඔවුන්ගේ සහභාගිත්වය, ඔවුන් ස්ත්‍රී සහ පුරුෂ සභිකයින් ලෙස වෙනස්කොටසැලකීම් වලට ලක් වන්නේද සහ පුරුෂ සභිකකයින්ගේ සමස්ත චර්යාව ආදිය අධීක්ෂණය කිරීම සඳහා ''ආකල්පමය වෙනසක්'': දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය ඉහළ දැමීම සඳහා අන්තර්කරණ රාජ්‍ය පාලනය සහ සුභවාදී ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමේ'' ව්‍යාපෘතියේ කොටසක් ලෙස කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් දිස්ත්‍රික් පහක ප්‍රාදේශීය ස්ත්‍රී සංවිධාන (ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය කුරුණෑගල, කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය බදුල්ල, ගැමි කාන්තා පෙරමුණ ගාල්ල, විලුදු ත්‍රිකුණාමලය, සහ කාන්තා සහයෝගීතා පෙරමුණ නුවරඑළිය) සමග එක්ව කටයුතු කරන ලදී. දිස්ත්‍රික්කයක එක් පාර්ශ්වකාර සංවිධානයකට 2018 ඔක්තෝබර් සිට 2019 දෙසැම්බර් කාලය දක්වා එම පළාත් පාලන ආයතනය කටයුතු කරන ආකාරය පිළිබඳව මාසික වාර්තා පිලියෙල කිරීම පැවරුණු අතර ඒවා සිය සොයා ගැනීම් මත පදනම් විය. සත්‍රීන් දෙදෙනෙක් හෝ හතරදෙනෙක් විසින් එක් එක් ප්‍රාදේශීය සභාවක් නිරීක්ෂණය කරන ලද අතර (කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් පුහුණු කරන ලද) නිරීක්ෂිකාවන් වෙත වාර්තාකරණ ආකෘතිද සපයා තිබුණි.

නිරීක්ෂණය කරන ලද කරුණු පිළිබඳ සවිස්තරාත්මක විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන අතර නිරීක්ෂණ කාලසීමාව තුළ නිරීක්ෂිකාවන් මුහුණ දුන් අභියෝග කිහිපයක් මෙහි සටහනක් තැබීමද වැදගත්ය.

# නිරීක්ෂිකාවන්ගේ සහභාගිත්වය

**සාර්ථකත්වයන් සහ අභියෝග**

නිරීක්ෂිකාවන් විසින් සිදු කරන ලද ඇගයීම් පිළිබඳව සභා කොමසාරිස්වරුන් ප්‍රසාදයෙන් පසුවීම නිසා බොහෝ ප්‍රාදේශීය සභා රැස්වීම් නිරීක්ෂණය කිරීමට නිරීක්ෂිකාවන්ට අවසර ලබා දී තිබුණත්, ඇතැම් සභා තුළ ඔවුන්ට විවිධ බාධා කිරීම් වලට මුහුණ දීමට සිදු විය. විවිධ හේතු මත මධ්‍යම සහ නැගෙනහිර පළාත් වල ප්‍රාදේශීය සභා රැස්වීම් නිරීක්ෂණය කිරීම අභියෝගාත්මක විය. ඇතැම් අවස්ථාවල පැමිණීම සනිටුහන් කිරීම සඳහා වූ ලේඛන නොමැති වූ අතර ඇතැම් සභාවල රැස්වීම් දින වෙනස් කර තිබුණත් ඒ බව දැනුම් දී නොතිබුනි. නිරීක්ෂිකාවන් සහ සභාව අතර සහයෝගිතාවය මඳ වීම හේතුවෙන් ඔවුන් හට සභාව වෙත ප්‍රවේශ වීමද තහනම් කොට තිබුණි. විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සභාවන් නිරීක්ෂණය සඳහා ගිය විලුදු සංවිධානය විසින් මුහුණ දෙන ලද අභියෝගයන්ය. කලින් සඳහන් කළ පරිදි ඔවුන්ට සභා රැස්වීම්වලට වාඩිවීමට ඉඩ ලබා නොදුන් අතර රැස්වීම් වලට සහභාගි වීම සඳහා වූ ආරාධනාවන් ලැබී තිබුණේ රැස්වීම් පවත්වන දිනයේදීමය. ඔවුන්ට ඉදිරි දිනයකදී සභා රැස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා සහභාගි විය හැකි බව ඇතැම් සභා දැනුම් දී තිබුණි. අනෙකුත් සභා වල මහජන ගැලරියේ ඉඩකඩ සීමා වී තිබුණු නිසා නිරීක්ෂණය කිරීම් අපහසු විය. ඇතැම් අවස්ථාවලදී නිරීක්ෂකයින් තිදෙනෙකු සහභාගි වන විට ලබා දී තිබුණේ පුටු දෙකක් පමණි. තවත් අවස්ථාවල සභා පිහිටුවා තිබුණේ 2018 පළාත් පාලන මැතිවරණයට පසුව බැවින් (පිහිටි පළාත් පාලන ආයතන 335, 341 දක්වා වැඩිකිරීම) නිරීක්ෂකයින්ට නිරීක්ෂණය සඳහා අවසර ලබා දී නොතිබිණි. කෙසේ වෙතත්, නිරීක්ෂණය කරන ලද සභාවන් පිළිබඳව සුභවාදී ප්‍රතිපෝෂණයක් ලබා දීමට නිරීක්ෂිකාවන්ට හැකි විය.

ඇතැම් නිරීක්ෂිකාවන් තුළින් අනාවරණය වූ කරුණක් වූයේ නිරීක්ෂණය යනු විවිධ පාක්ෂික වුවමනාවන් මත රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකමක්ය යන මතය සමහර සභිකයනන් තුළ පැවතී බවයි. 2020 පාර්ලිමේන්තු මැතිවරණය ආසන්නයේ පැවැත් වූ පුහුණු සැසියක් ගාල්ල පුරපතිවරයා විසින් කඩාකප්පල් කර තිබුණි.

**සභිකවරියන් සමග ඇති සබඳතාවය**

නිරීක්‍ෂණයට සම්බන්ධව වූ ස්ත්‍රී සංවිධාන, මෙයට පෙර සභිකවරියන් සමග කටයුතු කර තිබූ නිසාත්, නිරීක්‍ෂණ කණ්ඩායම්ද මෙම සංවිධාන හා සම්බන්ධ අය වූ නිසාත් සභිකවරියන් සමග සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමට නිරීක්ෂිකාවන්ට අවස්ථාව ලැබී තිබුණි. නිරීක්ෂණ ඉදිරියට යත්ම, නිරීක්ෂිකාවන්ට, සභිකවරුන් සමගද සමීපව කටයුතු කිරීමට අවස්ථාව ලැබුණු අතර එය මෙම කාර්යයේ ධනාත්මක ලක්‍ෂණයක් ලෙස සඳහන් කළයුතුය.

**නැවත වාර්තා කිරීම**

නිරීක්ෂණ කාලසීමාව අවසානයේදී එක් එක් හවුල්කාර සංවිධාන විසින් පළාත් පාලන ආයතන සභිකයින්, සභාවල සභාපතිවරුන්, දිස්ත්‍රික් කොමසාරිස්වරුන්, ආණ්ඩුකාරවරුන් සහ අදාල රාජ්‍ය නියෝජිතයන් නිරීක්ෂිකාවන්ගේ සොයාගැනීම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ රැස්වීම් පවත්වන ලදී. සභිකවරියන්, සභා රැස්වීම් වලදී සහ ඔවුන්ගේ ඡන්ද කොට්ඨාශ තුලදී ඔවුන් මුහුණ දෙන ලද අභියෝගයන් හා අත්පත් කරගත් ජයග්‍රහණයන් සහ ඔවුන්ගේ අත්දැකීම් සාකච්ඡා කරන ලදී. දිස්ත්‍රික් මට්ටමේ වාර්තා හරහා ඉදිරිපත් කරන ලද නිර්දේශ අදාල බලධාරීන් විසින් සැලකිල්ලට ගත් හෙයින් සභිකවරියන් සහ අදාල රාජ්‍ය නිලධාරීන් සමඟ සංවාදයකට මුලපිරීමට හැකිවීම ප්‍රයෝජනවත් කාරණයක් විය.

# නිගමන

ස්ත්‍රීන් සඳහා වූ අනිවාර්ය පංගු ක්‍රමය (කෝටාව) පළාත් පාලන ආයතන සභිකවරුන් ඇතුළු බොහෝ පිරිසක් විසින් අනවශ්‍ය දෙයක් ලෙස සැලකුවද, ප්‍රාදේශීය මට්ටමෙන් සියලුදෙනාම එකතු වී වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව තීරණ ගැනීම සඳහා පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රීන්ගේ වැඩි නියෝජනයක් තිබීම ඉතා යහපත් මූලාරම්භයක් බව කිවයුතුය. 2018 පළාත් පාලන මැතිවරණයේදී සභිකවරියන්ගේ සංඛ්‍යාව මෙන්ම සභිකවරුන්ගේ සංඛ්‍යාවද ඉහළ ගියේය. කීර්තිය, චර්යාව සහ බහුවිධ බව යන කරුණු මත ස්ත්‍රීන්ට  වැඩ කටයුතු කිරීමට ඇති ඉඩකඩ අභියෝගාත්මකය. ප්‍රධාන දේශපාලන පක්ෂ වලට අයත් සභිකවරියක නොවන්නේ නම් හෝ අත්දැකීම් සහිත සභිකවරියක නොවන්නේ නම් සභිකවරියන් විසින් ගෙන එනු ලබන යෝජනා බොහෝ විට ප්‍රතික්ෂේප වීමට ලක් වන බව නිරීක්ෂණයට හසු වූ කරුණකි. ඒ අනුව වසර ගණනක අත්දැකීම් ඇති සභිකවරියන් තරමටම නවක සභිකවරියකට කටයුතු කළ හැකිද යන ප්‍රශ්ණය මතු වේ. සභිකවරුන් හා සමානවම සභිකවරියන් විසින්ද ස්වකීය ඡන්ද කොට්ඨාශ වලට සේවය කරනු ඇතැයි යන විශ්වාසය මත පංගු ක්‍රමයක් පැවතීම අවශ්‍යය. මේ අනුව, ස්ත්‍රීන් ලෙස සිය කාර්ය භාරය සභාව තුළ පිළිගැනීමට ලක් වන්නේද, ඔවුන්  විසින් වඩාත් ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට සංවේදී යෝජනා ඉදිරිපත් කරන්නේද සහ පළාත් පාලන මට්ටමේදී ගනු ලබන තීරණ සිය ඡන්ද කොට්ඨාශ වලට ප්‍රතිඵලදායී වන්නේද යන්න අවබෝධ කර ගැනීමට මෙම අධ්‍යයනයෙන් උත්සාහ කෙරේ.

# සමස්ත සොයා ගැනීම් - දිස්ත්‍රික් නිරීක්ෂණය

**පළාත් පාලන ආයතන ක්‍රියාවලිය හැඳින්වීම**

25% අනිවාර්ය පංගු ක්‍රමය (Quota) හඳුන්වා දීමත් සමග පළාත් පාලන ආයතන තුළ නියෝජිතවරියන්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. එසේ නොවූවා නම් තවත් දශක කිහිපයකට පළාත් පාලන ආයතන තුළ දැකිය හැකි වනුයේ ස්ත්‍රීන් දෙතුන් දෙනෙකු පමණි. නව නීතියට අනුව සභාවක සංයුතියෙන් තුනෙන් එකක්වත් ස්ත්‍රීන් විය යුතුය. පළාත් පාලන මැතිවරණයෙන් පසුව තේරී පත් වූ හෝ පත් කරන ලද ස්ත්‍රීන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති වීම හේතුවෙන් ස්ථාපිත කිරීමට නොහැකි වූ පළාත් පාලන ආයතන 16 ක් තිබුණි. එය 25% කෝටාව පිළිබඳ සෘණාත්මක මතයක් ඇති කළ අතර ස්ත්‍රීන් දේශපාලනය තුළ සිටිනවාට අකමැති පුරුෂයෝ එය සමාජගත කිරීමට දැඩි වෙහෙසක් ගත්හ. බොහෝ පුරුෂයන් තුළ ස්ත්‍රීන් කෙරෙහි තරහක් ඇති බවත්, දේශපාලනය තුළ තමන්ට හිමි ස්ථානය ස්ත්‍රීන් විසින් පැහැරගෙන ඇති බව ඔවුන් විශ්වාස කරන බවත් අධ්‍යයනය තුළ සොයාගෙන තිබුණි.

මූලික අවස්ථාවේදී බොහෝ ස්ත්‍රීන් සක්‍රිය ලෙස කටයුතු කිරීමට අකමැත්තක් දක්වා තිබුණේ 25% අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා දේශපාලන පක්ෂ විසින් ඔවුන් නම් කොට තිබුණු නිසාත්, එහෙයින් ප්‍රමාණවත් ලෙස සූදානම්ව නොසිටි නිසාත් බව අධ්‍යයනය විසින් අනාවරණය කොට ගෙන තිබුණි. නුවරඑළියේ එක් නිරීක්ෂකයෙකු විසින් සඳහන් කළ පරිදි මැතිවරණ මැතිවරණයට තරඟ කිරීමට නොහැකි සිය පියවරුන් හෝ ස්වාමි පුරුෂයන් වෙනුවට නාම යෝජනා ලැබූ ස්ත්‍රීන් බොහෝ පිරිසක් සිටියහ.

සභිකවරියන් ලෙස සිය අත්දැකීම් පිළිබඳව බොහෝ ස්ත්‍රීන් සුභවාදීව අදහස් දැක්වුවද, ඇතැම් අයට එය පළමු අවස්ථාව වී තිබුණි. මුල් කාල සීමාවේදී ස්ත්‍රීන් පසුපස අසුන් වල හිඳගෙන සිටියද කාලයත් සමග ඔවුන් විශ්වාසය ගොඩ නගා ගෙන සභාවේ කටයුතු තුළ ඉතා සක්‍රීයව නියැලී ඇත. පරාජය වූ අයවැය වලට එරෙහිව සභිකවරියන් තර්ක කරන ලද අවස්ථාද තිබුණි. සභාවේ කටයුතු තුළ සක්‍රීය ලෙස සහභාගී වූ එසේම අනර්ථකාරී යැයි දැනුණු අයවැය ප්‍රතිපාදනයන්ට එරෙහිව අන්‍යයන් සමග එක්ව විවාද කොට ඒවා පරාජය කිරීමට ස්ත්‍රීන් කටයුතු කළ අවස්ථා ඇත.

විවිධ රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙම සභිකවරියන් සඳහා පුහුණු හඳුන්වාදීමත් සමග මැතිවරණයෙන් පසු කාලයේදී ඔවුන්ගේ කාර්ය සාධනය ඉහළ ගොස් තිබුණි. එවකට පුහුණුව සඳහා අවස්ථාව නොලද සභිකවරියන්ද මේ වන විට පුහුණුව ඉල්ලා සිටී. මෙම අධ්‍යයනය සහ මේ හා සමාන වෙනත් පර්යේෂණයන් විසින් පෙන්වා දී ඇති පරිදි මීට හේතු වන්නේ පළාත් පාලන පනත සහ සභාවේ ක්‍රියාකාරිත්වයන් පිළිබඳව සභිකයින් තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීමයි.

## කුරුණෑගල දිස්ත්‍රික්කය

**සභිකවරියන් සභා රැස්වීම් කටයුතුවල නියැලුණු ආකාරය**

2019 වසරේ දෙසැම්බර් මාසයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය සභාව විසින් එහි සියලු කාරක සභා තුළ 50% ක ස්ත්‍රී නියෝජනයක් තිබිය යුතු බවට ගනු ලැබූ තීරණය විශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය.

ස්ත්‍රීන්ද සිය ශක්තිය විදහා පෙන්වීමට පටන් ගෙන තිබුණි. ඔවුන්ට කතා කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක්, එකිනෙකාට සහාය ලබා දීමට අවස්ථාවත්, ස්ත්‍රීන්ට හානිකර පුරුෂ සභිකයින්ගේ ක්‍රියාකාරකම්වලට එරෙහිව හඬ නැගීමටත් අවස්ථාව තිබුණි. මුල්කාලයේදී කුඩා පක්ෂ නියෝජනය කළ සභිකවරියන්ට කතා

කිරීමට කාලයක් ලබා දී නොතිබුණත් දෙවැනි වසර වන විට එම සභිකාවරියන්ටත් සභා රැස්වීම් ඇමතීමට කාලය ලැබී තිබුණි.

විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් වන්නේ, නිරීක්ෂණය සඳහා තෝරා නොගත් සභා තුලත් කාන්තා කමිටු පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දී තිබීමයි.

සභාවන් බොහෝ විට හොඳින් සංවිධානය වී ඇති අතර සභා ලේකම්වරයා විසින් සකස් කර දෙනු ලබන න්‍යාය පත්‍රය අනුව දිනයේ වැඩ කටයුතු සිදු කෙරේ.

අධ්‍යයනයේදී අනාවරණය වූ තවත් කරුණක් වූයේ බොහෝ විට සභිකාවරියන් විසින් භාර දෙනු ලබන යෝජනා නොසලකා හරිනු ලබන බවක් හෝ පසු දිනකදී සලකා බැලීම පිණිස පසෙකට දමන බවක් ය. එය එසේ නොවූයේ පාලක පක්ෂයේ සභිකාවරියන් සම්බන්ධයෙන් පමණි. (උදා : ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ) සෑම සභාවකම පාහේ දක්නට ලැබුණු දෙයක් වූයේ එකම සභික පිරිසක් විසින් යෝජනා ඉදිරිපත් කිරීමයි. කුරුණෑගල මහ නගර සභාවේ මන්ත්‍රීවරියක් පැවසුවේ ඇයගේ යෝජනාව රැස්වීමේ කාර්ය සටහන් තුළ ඇතුළත් නොකළ බවයි. ඒ අවස්ථාවේදී පාලක පක්ෂයේ මෙන්ම විරුද්ධ පක්ෂයේද මන්ත්‍රීවරුන් විසින් ඊට විරෝධය දැක්වීම හේතුවෙන් සභා කටයුතු පවත්වාගෙන යාම අපහසු වී ඇත.

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභිකාවරියන් විසින් භාර දෙන ලද යෝජනා අතුරින් ක්‍රියාවට නංවා තිබුනේ 10% ක් පමණි. ලබා දී ඇති සීමිත ඉඩ ප්‍රස්ථා හේතුවෙන් සභිකාවරියන්ට සිය ශක්තීන් ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ලැබෙන්නේ නැත. සභිකාවරයන් හා සමාන කාලයක් සභිකාවරියන්ට නොලැබෙන අතර විපක්ෂයේ සභිකාවරියන්ට එය ඊටත් වඩා අඩු ය.

සිය සභා කටයුතු, පක්ෂ කටයුතු සහ ගේදොර වගකීම් අතර කාල වේලාව බෙදා ගැනීම සභිකාවරියන්ට අතිශය අභියෝගකාරීය.

**සභිකාවරියන් පිළිබඳව පුරුෂයින්ගේ ආකල්පය**

චර්යාව පැත්තෙන් බැලූ කළ පුරුෂයන් මෙන්ම ස්ත්‍රීන්ද අන්‍යයන්ගේ සමච්චලයට භාජනය වේ. මෙහිදී විශේෂ කරුණක් වන්නේ ස්ත්‍රී පුරුෂ භාවය සහ කුලය හේතුවෙන් ස්ත්‍රීන්, පිරිමි සභිකයින්ගේ ද්වේශ සහගත ප්‍රකාශයන්ට භාජනය වීමයි. ලිංගික අල්ලස් හෝ උදව් ලබා දීම හරහා ස්ත්‍රීන් දේශපාලනයට පිවිස ඇතැයි යන මතය පිරිමි සභිකයින්ගේ අදහසයි. ඇතැම් සභිකවරුන්, සභිකාවරියන්ට එරෙහිව මෙලෙස ද්වේශ සහගත ප්‍රකාශ සිදු කරද්දී අනෙකුත් සභිකවරුන් සිය සභිකාවරියන්ට අවශ්‍ය සහාය ලබා දෙන බව නිරීක්ෂණයට හසු වූ කරුණකි. සභිකාවරියන් සිය අදහස් දැක්වූ පසු සභිකවරුන් එම සභිකාවරියන්ගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ප්‍රශ්න කරමින් ඔවුන්ගේ ධාරිතාවයන් හෑල්ලුවට ලක් කිරීමට කටයුතු කර ඇත.

සභිකාවරියන් වෙනත් දේශපාලන පක්ෂයක් නියෝජනය කළද, ඇතැම් සභාපතිවරුන් ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දෙන නමුත් ඇතැම් සභා වල සභාපතිවරුන් එලෙස ඔවුන්ට සහාය වන්නේ නැත .

**අදාළ පුහුණුවේ වැදගත්කම**

නිලයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ආත්ම ශක්තිය සහ දූෂණයට එරෙහි වීමට ඇති ශක්තිය සභිකාවරියන්ට ලැබී තිබුණේ සිවිල් සංවිධාන විසින් ඔවුන්ට ලබා දී තිබූ පුහුණු වැඩසටහන් හේතුවෙනි.

කෙසේ වෙතත් සභිකාවරියන්ට සමාජ මාධ්‍ය මෙවලම් භාවිතා කිරීම පිළිබඳ වැඩිදුර අවබෝධයක් අවශ්‍ය වන අතර ඔවුන් සිදු කරන කටයුතු පිළිබඳ මාධ්‍යය විසින් මීට වැඩි ප්‍රචාරයක් ලබා දිය යුතුය.

සිය පවුල, මිතුරු මිතුරියන් සහ සිය පක්ෂවල ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් වෙතින් ලැබෙන සහාය සභිකාවරියන්ට මහත් දිරියකි. එසේම ස්ත්‍රී කණ්ඩායම් සහ ප්‍රජා සංවිධාන මගින් ලැබෙන සහාය සහ මැතිවරණ කොට්ඨාශ වලින් ලැබෙන දිරිය ඔවුන් බෙහෙවින් අගය කරයි.

**කාලය වෙන් කිරීම**

රැස්වීම් වලදී කතා කිරීමට සභිකවරියන්ට අවස්ථාව තිබුණද බොහෝ අවස්ථාවලදී සභිකවරුන් විසින් ඔවුනට බාධා පමුණුවනු දක්නට ලැබුණි.

**ස්ත්‍රී ප්‍රශ්න පිළිබඳ ඇති සංවේදීතාවය**

රැස්වීම් තුළදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වීමේ අවශ්‍යතාවයක් සභිකවරුන්ට නොමැති වීම හේතුවෙන් සිය වගකීම් ඉටු කිරීමේදී සභිකවරියන් සෘණාත්මක ලෙස බලපෑමට ලක් වේ.

අනෙක් කරුණ නම් වෙනත් රාජ්‍ය ආයතන වෙතින් සභිකවරියන්ට ප්‍රමාණවත් පිළිගැනීමක් නොලැබීමයි. මෙම ගැටළුව විසඳා ගැනීම සඳහා යම් ආකාරයක හැඳුනුම්පත් ක්‍රමයක් හඳුන්වා දෙන ලෙස සභිකවරියන් විසින් ඉල්ලීම් සිදු කොට ඇත.

**අරමුදල් සැපයීම**

සභිකවරියන් හා සභිකවරුන් යන දෙපාර්ශ්වයම අරමුදල් ලබා ගැනීම දුෂ්කර වන අතර සිය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා සභිකවරියන් විශේෂයෙන් වෙහෙස වී කටයුතු කර ඇත. අරමුදල් වෙන්කර දෙන ලද අවස්ථාවලදී සිය කොට්ඨාශ තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට සභිකවරියන්ට හැකියාව ලැබී ඇත. කෙසේ වෙතත් ඇතැම් සභිකවරියන්ට විශාල ව්‍යාපෘති හා විශාල මුදල් වෙන් කිරීම් සමග කටයුතු කිරීම දුෂ්කරය. කොන්ත්‍රාත්කරුවන් විසින් ඔවුන් රැවටීමට උත්සාහ ගත් අවස්ථා නිරීක්ෂණය කොට ඇත. එසේම විරුද්ධ පක්ෂය නියෝජනය කරන සභිකවරියන්ට සම්පත් ලැබෙන්නේ ඉතා අල්ප වශයෙනි.

සභිකවරියන් විසින් ක්‍රියාත්මක කරනු ලබන කටයුතු පිළිබඳ ඔවුන් ඉතා අල්ප ප්‍රසිද්ධියක් ලබන අතරම, කොන්ත්‍රාත්කරුවන් ඔවුන් සමග කටයුතු කිරීමේදී දරන ආකල්පය සභිකවරුන් සමග කටයුතු කරන විට දරන ආකල්පයට වඩා වෙනස් ය. එසේම සිදුකරනු ලැබ ඇති වැඩ කටයුතු වෙනුවෙන් මුදල් නිදහස් කර ගැනීමට යාමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලදී ඔවුන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණපායි.

එසේම ස්වකීය සංවර්ධන කටයුතු සිදුකරගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් සපයා දීමේදී දිස්ත්‍රික් නායකයින් සහ අමාත්‍යවරුන් වෙතින් ලැබෙන සහාය ඔවුන් කෘතඥතා පූර්වකව සිහි කර සිටී.

## ගාල්ල දිස්ත්‍රික්කය

**සභා රැස්වීම්වලට සභිකවරියන් සම්බන්ධ වන ආකාරය**

සෑම සභාවකම පාහේ කුඩා දේශපාලන පක්ෂවලට පිළිගැනීමක් ලැබෙන්නේ නැත. එසේම සභාව තුළ කුඩා දේශපාලන පක්ෂ නියෝජනය කරන නියෝජිතවරියන් නොමැත. සියලු පළාත් පාලන ආයතන තුළ වගේම කුඩා දේශපාලන පකෂවලට පිළිගැනීමක් ලැබෙන්නේ නැත එසේම කුඩා දේශපාලන පකෂ නියෝජනය කරනු ලබන ස්ත්‍රීන් ඉතා විරල වීම විශේෂයෙන් සඳහන් කළයුතු කරුණකි. සභා නියෝජනය කරනු ලබන ස්ත්‍රීන්ගෙන් බහුතරයක් විශාල හා හොඳින් ස්ථාපිත වී ඇති දේශපාලන පකෂ වල සාමාජිකාවන් ය. ගාල්ල මහ නගර සභාව තුළ ගුණාත්මක වෙනසක් දක්නට ලැබීම නිරීකෂණයට ලක්විය. එනම් මන්ත්‍රීවරුන්ට වඩා මන්ත්‍රීවරියන් කාර්යශූරව කටයුතු කිරීමයි.

ප්‍රධාන පෙළේ දේශපාලන පක්ෂ නියෝජනය කරන සභිකවරියන්ට යෝජනා ඉදිරිපත් කිරීමේ ඉඩකඩ ඇති අතර ඒවා පහසුවෙන් අනුමත කෙරේ. නමුත් කුඩා දේශපාලන පක්ෂවල සභිකවරියන් වෙතින් එන යෝජනා සමච්චලයට භාජනය වීම හෝ නොසලකා හැරීමට ලක් වේ.

ඒ කෙසේ වෙතත්, ගුණාත්මක වෙනසක් නිරීක්ෂණය කරනු ලැබුවේ ගාල්ල මහ නගර සභාව තුලය. වසරේ මුල් කාලය තුළ සභා රැස්වීම් තුළ පූර්ණ වශයෙන් සහභාගි වීමට මන්ත්‍රිවරියන්ට නොහැකි වුවත් එම වසරේම ඔක්තෝබර් මාසය වන විට ඔවුන් බෙහෙවින් ඉදිරියට පැමිණ තිබුණි. තමන්ට ලබා දුන් කාලයෙන් ප්‍රයෝජනය ගැනීමට ඔවුන් ඉගෙන ගෙන තිබුණි. තමන්ව පත් කරනු ලබන කාරක සභා තුළ මන්ත්‍රීවරියන් ඉතා සක්‍රිය ලෙස  කටයුතු කරයි.

අක්මීමණ ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් 6 දෙනෙකු අතුරින් කිසිවෙකුත් 2019 ජනවාරි මාසය වන තෙක් එකදු යෝජනාවක් හෝ ඉදිරිපත් කොට තිබුණේ නැත. 2019 දෙසැම්බර් මස අවසන් වාර්තාවට අනුව සභාවට ඉදිරිපත්ව තිබූ ඉතාමත්ම කාලීන සහ පලදායී යෝජනා ඉදිරිපත් කොට තිබුනේ සභිකවරියන් විසිනි. මින් පෙර මාසවල වාර්තා සමග සසඳන කල මෙම කාලය වන විට සභිකවරියන් ඉතා ඉහළ මට්ටමක් කරා ළඟා වී තිබුණි. බද්දේගම ප්‍රාදේශීය සභාවේ සභිකවරියන්ගේ වැඩ කටයුතුවල කැපී පෙනෙන ප්‍රගතියක් නිරීක්ෂණය කොට තිබුණි.

මින් පෙර සභිකවරියන් සිය කටයුතු තුළ එතරම් සක්‍රිය ලෙස නියැලීමක් නොවුණු අතර සභිකවරියන් සභාව තුළ ඊට වැඩි දායකත්වයක් සැපයිය යුතු බව නිරීක්ෂකයින්ගේ මතය විය.  කෙසේ වෙතත් අප්‍රේල් මාසය වන විට සභිකවරියන් තුළ සංවර්ධනයක් දක්නට ලැබුනු අතර ඔවුන් පෙරට වඩා උනන්දුවකින් යුතුව කටයුතුවල නිරත වුණි.  හික්කඩුව ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් රැස්වීම් වලට සහභාගි වූයේ ඉතා කලාතුරකින් වූ අතර ඔවුන් විසින් ඉදිරිපත් කොට තිබූ යෝජනා ස්ත්‍රීන්ගේ  සුභසාධනය අරමුණු කොට ගත් ඒවා නොවේ. කෙසේ වෙතත් ඔක්තෝබර් මාසයේදී මාතෘ හා ළමා සෞඛ්‍යය කේන්ද්‍ර කොටගත් විශේෂ රැස්වීමක් සභාව තුළ පැවතුණි.

**සභිකවරියන් පිළිබඳව සභිකවරුන්ගේ ආකල්පය**

සභිකවරුන් විසින් වැඩි කාල වේලාවක් ලබා ගැනීම හේතුවෙන් සභිකවරියන්ට සිය කරුණු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම අඩුපාඩුවක් ලෙස නිරීක්ෂණය කරන ලදී. ඇතැම් අවස්ථාවලදී සභිකවරියන් සිය අදහස් ප්‍රකාශ කරද්දී සභිකවරුන් ඊට බාධා එල්ල කරන බවක් දක්නට ලැබුණි. එම තත්ත්වය අප්‍රසන්න වුවත් සභිකවරියන් ඊට එරෙහිව හඬක් නගන්නේ නැත. ඔක්තෝබර් මාසය වන විට ස්ත්‍රී සහභාගිත්වය ඉහළ ගොස් තිබූ අතර  ඔවුන්ට සභාවේ අවධානය යොමු ව තිබුණි.

අක්මීමණ ප්‍රාදේශීය සභාව තුළ හැම දේශපාලන පක්ෂයක් සඳහාම කතා කිරීමට සමාන කාලයක් ලබා දේ. සභාව තුළ පුරුෂාධිපත්‍යය පැහැදිලිව පෙනෙන්නට තිබෙන අතර ස්ත්‍රීන් සහභාගි වීමෙන් වැළකී සිටී. අවම වශයෙන් එක් සභිකවරියක් හෝ සභාවේ කාරක සභා සඳහා පත් කරනු ලබයි. ස්ත්‍රීන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් බේරා ගැනීමේ අවශ්‍යතාවය සභාව විසින් මතු කොට ඇත. ගර්භනී මාතාවන් හා ළමුන් ඉලක්ක කොට ගත් පෝෂණීය ආහාර මල්ලක් ලබා දීමේ වැඩසටහන ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වේ.

බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභාව තුළ ඒකාධිපති චර්යාවක් නිරීක්ෂණය කළ අතර එහි සභිකවරියන්ට කතා කිරීමට අවස්ථාව ලැබී තිබුණේ ඉතාමත්ම අඩුවෙනි. කතා කිරීම සඳහා සමාන කාලයක් සභිකවරියන්ටද ලබා දී තිබුණත් සභිකවරුන් සාකච්ඡාවන් සියතට ගනී. නොවැම්බර් මාසය වන විට පැවති තත්ත්වය එය වුවත් දෙසැම්බර් සහ ජනවාරි මාස වන විට සභාව තුළ කතා කිරීම සඳහා වැඩි වේලාවක් සභිකවරුන් විසින් සභිකවරියන් වෙත ලබා දී තිබුණි.

ස්ත්‍රීන් සඳහා වූ කෝටාව පිළිගත නොහැකි බවත් ස්ත්‍රීන්ට පළාත් පාලන දේශපාලනය පිළිබඳ අවබෝධයක් නොමැති බව, විශ්වාස කරන සභිකවරුන්ගෙන් අඛණ්ඩ එදිරිවාදිකම් එල්ල වෙමින් පවතී.

### අදාල පුහුණුවේ වැදගත්කම

අධ්‍යයනයේ මුල් කාලය තුළ සභිකවරියන් යම් පසුගාමී තත්ත්වයක් ප්‍රදර්ශනය කළද පසුව සභාව ක්‍රියාත්මක වීමත් සමග ඔවුන් ඊට සම්බන්ධ වීමේ වර්ධනයක් දක්නට ලැබුණි. එම වර්ධනයට එක් හේතුවක් වූයේ ගැමි කාන්තා පෙරමුණ විසින් පහසුකම් සපයන ලද පුහුණුවයි. එහිදී නායකත්ව විභවතාවයන් සහිත ස්ත්‍රීන් හඳුනාගෙන ඔවුන්ට පුහුණුව සඳහා ආරාධනා කරන ලදී. සියළු දෙනා ආරාධනාව පිළිගෙන නොතිබුණද, පුහුණුව ආරම්භ වීමත් සමඟ, නිරීක්ෂණය සඳහා තෝරාගෙන නොතිබුණු සභාවල සභිකවරියන් වෙතින් පවා පුහුණුව ලබා දෙන ලෙස ඉල්ලීම් ලැබුණි. පුහුණුවෙන් අනතුරුව සභිකවරියන් තුළ විශේෂ වෙනසක් දක්නට ලැබුණි. ඔවුන් සක්‍රිය ලෙස විවාද වලට සහභාගි වූ අතර සභා අයවැය වලට විරුද්ධව අදහස් දක්වා තිබුණි.

සභිකවරියන් වෙත ප්‍රවේශ වී ඔවුන් සමග කටයුතු කරන්නේ කෙසේද සහ ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතා ගැමි කාන්තා පෙරමුණ විසින් අවබෝධ කොට ගෙන තිබුණි. හම්බන්තොට සහ මාතර ප්‍රදේශවල ස්ත්‍රීන්ද ඇතුළුව ස්ත්‍රී කණ්ඩායමක්, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අධීක්ෂණය කිරීමේ මධ්‍යස්ථානය (CMEV) විසින් පවත්වනු ලබන වැඩමුළු සඳහා සම්බන්ධව කරමින් අවශ්‍ය පහසුකම් සැපයීමේ මූලිකත්වය ගෙන කටයුතු කොට තිබුණි. එසේම තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ අවබෝධයද එම ස්ත්‍රීන්ට ලබා දී තිබුණි.

තමන්ව නිරීක්ෂණයට ලක් කිරීම පිළිබඳව ඇතැම් සභා කැමැත්තක් දැක්වූයේ නැත. 2020 පාර්ලිමේන්තු මැතිවරණය ආසන්නයේ පැවති පුහුණු සැසියක් ගාල්ල පුරපතිවරයා විසින් කඩාකප්පල් කොට තිබුණි.

## බදුල්ල දිස්ත්‍රික්කය

### සභා රැස්වීම්වලට සභිකවරියන් සම්බන්ධ වන ආකාරය

බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන මැතිවරණ ඉතිහාසයේ පළමු වරට සිදු වූ විශේෂ කාරණයක් වන්නේ දමිළ සභිකවරියන් 12 දෙනෙකු සහ මුස්ලිම් සභිකවරියක් සභාවල සභිකවරියන් ලෙස පත්වීමයි. ඒ අනුව ස්ත්‍රීන් සඳහා වූ කෝටාව හේතුවෙන් වතුකර ස්ත්‍රීන් බොහෝ දෙනෙකුට පළාත් පාලන ආයතන තුළ සිය ප්‍රජාව නියෝජනය කිරීමට අවස්ථාව උදා වූ අතර, එමගින් වතුකරයේ ගැටලු පිළිබඳව සභාව තුළ මෙන්ම මහජානතාව අතර වැඩි දැනුවත් භාවයක් ඇති කිරීමට අවස්ථාව උදා විය.

අභියෝග තිබුණද ස්ත්‍රීන් විසින් ක්‍රමිකව සිය ස්ථානය තහවුරු කර ගන්නා ආකාරය නිරීක්ෂණය කරන ලදී. ඇතැම් ස්ත්‍රීන් තරඟ කිරීම සඳහා නම් කොට තිබුණේ හෝ පත් කොට තිබුනේ 25% අවශ්‍යතාවය සපුරාලීම සඳහා පමණක් වූ නිසා ඔවුන් සිය රාජකාරි ඉටු කිරීම සඳහා සූදානමින් පසුවූයේ නැත. ස්ත්‍රීන් කිහිප දෙනෙකුගේ කලත්‍රයන් වෘත්තිය සමිති ක්‍රියාකාරීන් වූ අතර අනෙක් අය නම් කොට තිබුණේ ඥාතියෙකු වෙනුවෙනි. එවන් අවස්ථාවලදී සභාවල ක්‍රියාකාරිත්වය සහ තමන්ගේ භූමිකාවන් අවබෝධ කර ගැනීමට එම සභිකවරියන්ට යම් කාලයක් ගත විය.

සභාව නියෝජනය කිරීමට වතුකරයේ ස්ත්‍රියකට ඉඩකඩ ලබා දෙන විධිවිධාන පළාත් පාලන ආයතන පනත තුළ අන්තගර්ත වේ. මෙය සභාව තුළ මෙන්ම ඉන් පිටතත් එම ප්‍රජාවට අනන්‍ය වූ ගැටළු අවබෝධ කරගැනීමේ අවශ්‍යතාවය මතු කරන්නට විය.

බදුල්ල ප්‍රාදේශීය සභාව තුළ සභිකවරියන් විසින් යෝජනා ගණනාවක් භාර දී ඇති අතර ඒවා සභාව විසින් අනුමත කොට ඇත. විශේෂයෙන් එක් සභිකවරියක් විසින්ම සෑම රැස්වීමකදීම පාහේ යෝජනාවක් ඉදිරිපත් කොට ඇති අතර ඒවායින් අඩක් පමණ අනුමත කොට ඇත. සමහර සභිකවරියන් තුල ඉතාමත් ක්‍රියාශීලී බවක් දක්නට ලැබුණ අතර, එසේ නොවූ අයද සභිකවරියන් අතර විය.

හාලිඇල ප්‍රාදේශීය සභාව තුළ සභිකවරියන් හට සිය අදහස් දැක්වීම සඳහා කාලය වෙන් කොට දී තිබුණද ඔවුන් ඒවා ප්‍රයෝජනයට නොගන්නා අවස්ථාවන්ද දක්නට ලැබුණි. යෝජනා ඉදිරිපත් කරන්නේ සභිකවරියන් කිහිප දෙනෙකු පමණි. තමන් ඉදිරිපත් කළ යෝජනා අනුමත කර තිබුණත් ඒවා ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය අරමුදල් තමන් වෙත ලැබී නැතැයි පස්සර ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් චෝදනා කරයි. යෝජනා අනුමත නොකරන බැවින් හා අරමුදල් සම්මත කොට නොදෙන බැවින් සභා රැස්වීම් වලට සහභාගි වීමේ උනන්දුව හීන වී ගොස් ඇති බව එක් සභිකවරියක පැවසුවාය.

සොරණාතොට ප්‍රාදේශීය සභාව තුළ සභිකවරියන් වෙනස්කොට සැලකීමට ලක් නොවන නමුත් ඔවුන් හට සිය අදහස් ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති කාලය ඔවුන් විසින් නිසි ලෙස ප්‍රයෝජනයට නොගන්නා බවක් දක්නට ලැබුණි..

**සභිකවරියන් පිළිබඳව සභිකවරුන්ගේ ආකල්පය**

ලැයිස්තුවෙන් පත් වූ සභිකවරියන් හට වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැත. එසේම රැස්වීම් වලදී ඔවුන් අදහස් ඉදිරිපත් කරන විට ඒවා සමච්චලයට ලක් වේ. එසේම ඇතැම් සභිකයින් නියමිත වේලාවට කටයුතු නොකරන අතර ඇතැමුන් වේලාසනින් රැස්වීම් වලින් පිටව යයි. මෙය සභිකවරියන්ට මෙන්ම සභිකවරුන්ටද පොදු ය.

ඇතැම් සභා තුළ සභිකයන්, සභිකවරියන්ට අවශ්‍ය සහාය ලබා දේ. සභාවේ විවිධ කාරක සභා තුළ කටයුතු කිරීමට සභිකවරියන්ට අවස්ථාව තිබුණද ඔවුන්ව බොහෝ විට පත් කරනු ලබන්නේ පරිසර කාරක සභාවට වන අතර මූල්‍ය, කර්මාන්ත හෝ ප්‍රජා සංවර්ධන කාරක සභා වෙතින් ඉවත් කොට තබනු ලබයි. කෙසේ වෙතත් මෙම අනිවාර්ය පංගු ක්‍රමය මැතිවරණ ව්‍යාපාරයකට සීමා නොවී මහජනතාවට සේවය කිරීම සඳහා තමන්ට ලැබුණු අවස්ථාවක් ලෙස සභිකවරියන් සලකයි.

හාලිඇල ප්‍රාදේශීය සභාව පළමු වරට රැස් වූ අවස්ථාවේදී අභිනවයෙන් තේරී පත් වූ සභිකයන්ට (කාන්තා හා පුරුෂ දෙපක්ෂයටම) නිසි ගෞරවය ලබා දී නොතිබුණු බව වාර්තා විය. කෙසේ වෙතත් මෙම ගැටලුව සුහදශීලී ලෙස විසඳා ගෙන තිබුණි. බදුල්ල ප්‍රාදේශීය සභාව තුළ සභිකවරියන් අදහස් දක්වන විට බාධා කිරීම් නොමැත. සොරණාතොට ප්‍රාදේශීය සභාව තුළ සභිකවරියන්ට ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට අදාල කරුණු සාකච්ඡා කළ හැකි අතර ජාත්‍යන්තර ස්ත්‍රී දිනයට සමගාමීව ස්ත්‍රීන් සඳහා වැඩමුළු සංවිධානය කළ හැකිය.

**කාලය වෙන් කිරීම**

කාලය වෙන් කිරීම සම්බන්ධයෙන් ගැටළු වාර්තා වී ඇත. ඇතැම් අවස්ථාවලදී ජ්‍යෙෂ්ඨ සභිකයින් විසින් වැඩිපුර කාලය ගැනීම හේතුවෙන් සභිකවරියන්ට වෙන්ව ඇති කාලය හදිසියේම ඔවුන්ට අහිමි වී යයි. මෙම තත්ත්වය පළමු වරට සභාවට පත් වූ සභිකවරියන්ට මෙන්ම සභිකවරුන්ට ද මුහුණ දීමට සිදුව ඇත. බොහෝ අවස්ථාවලදී ඔවුන්ගේ යෝජනාවන් විවේචනයට ලක් වේ. එසේම හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් කාලය වෙන් කිරීම සම්බන්ධයෙන් අසීරුතාවයන්ට මුහුණදේ. ඊට හේතුව වන්නේ සභාව තුළ සභිකයින් 40 දෙනෙකු සිටින නිසයි.

**ස්ත්‍රීන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් ඇති සංවේදීතාවය**

බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය සභාව තුළ ස්ත්‍රීන්ගේ ප්‍රශ්න කෙරෙහි යහපත් සංවේදිතාවයක් දක්වයි. උදාහරණයක් ලෙස එහි සභාපති ස්ත්‍රියක් නිසා 2019 මාර්තු මස පැවති සභා රැස්වීමේදී ඇය පවසා ඇත්තේ ස්ත්‍රීන් මුහුණ දෙනු ලබන ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා සියලු දෙනා එකට එක්ව කටයුතු කළයුතු බවයි.

**අරමුදල් සැපයීම**

සභිකවරියන්ගේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් නොලැබීම හෝ සීමාසහිත අරමුදල් වෙන් කිරීම පොදුවේ නිරීක්ෂණය කරන ලද කරුණකි. විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන්ද තත්ත්වය එසේම ය. එසේම දේශපාලන පක්ෂ විසින් සපයනු ලබන අරමුදල් වලින් සභිකවරියන්ට අනුමත කරනු ලබන්නේ සීමිත සම්පත් ප්‍රමාණයකි. 2018 මාර්තු මාසයේ පටන් දේශපාලන පක්ෂ වලින් කිසිදු මූල්‍ය ප්‍රතිපාදනයක් නොලද සභිකවරියන් සිටින බව නිරීක්ෂණයේදී අනාවරණය විය. මුළු වසර පුරාම සිය සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කිසිදු මුදල් ප්‍රතිපාදනයක් නොලැබීම පස්සර ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් මුහුණ දෙන ප්‍රබලතම ගැටළුවකි. සභිකවරියන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා රැස්වීම් වාර්තා තුළ අන්තර්ගත නොවන අවස්ථා මෙන්ම සංශෝධනයන් ඉදිරිපත් කිරීමේදී පවා ඒවා වාර්තාවලට ඇතුලත් නොවන අවස්ථා නිරීක්ෂණය කොට ඇත.

## නුවරඑළිය දිස්ත්‍රික්කය

**සභා රැස්වීම්වලට සභිකවරියන් සම්බන්ධ වන ආකාරය**

අනිවාර්ය කෝටා ක්‍රමය හඳුන්වා දීමත් සමග සභිකවරියන් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. එය හොඳ ලක්ෂණයක් වුවත්, පළාත් පාලන ආයතන වල ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම මඳ වීම හෝ නොමැති වීම හේතුවෙන් සභිකවරියන් මාර්ගෝපදේශයන් අපේක්ෂා කරයි.

මෙම තත්ත්වය හේතුවෙන් බොහෝ සභිකවරියන් සභා කටයුතු තුළ පූර්ණ වශයෙන් සහභාගි වීමට අකමැත්තක් දක්වන බව නිරීක්ෂිකාවන් විසින් පෙන්වා දී ඇත. එසේම දමිළ සභිකවරියන්ට සිංහල භාෂාවෙන් කතා කළ හැකි වුවද ඇතැම් සාකච්ඡාවන් තුළ සංවාදයට බඳුන් වන සංකීර්ණ කරුණු අවබෝධ කරගැනීමට ඔවුන්ට අපහසුතාවයක් ඇත. ඒ හේතුවෙන් ඔවුන්ට ක්ෂණිකව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාවක් නොමැත.

එසේම රැස්වීම් වල වාර්තා සභිකයින් වෙත පසුව ලබා දෙන බැවින්, ඊළඟ රැස්වීම සඳහා සූදානම් වීමට ඔවුන්ට කාලය ප්‍රමාණවත් නැත. සභාව විසින් මෙම කරුණ ආමන්ත්‍රණය කළ යුතු බවත් එය කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්තියක් ගෙන ආ යුතු බවත් කාන්තා සහයෝගීතා පෙරමුණේ අදහසයි. ඊට අමතරව, අරමුදල් උත්පාදනය කරගත හැකි ආකාරයේ වාර්තා සකස් කිරීම පිළිබඳව සභිකවරියන්ට පුහුණුවක් ලබාදීම අවශ්‍යය ය.

අනෙක් සභිකයින් තරමට උසස් අධ්‍යාපනය නොලැබූ සභිකවරියන් දෙදෙනෙකු සිටී. කෙසේ වෙතත්, ශක්තිමත් වෘත්තිය සමිති පසුබිම හේතුවෙන් සක්‍රිය ලෙස  සභා කටයුතු වල නියැලීමටත් අපේක්ෂිත පරිදි සිය වගකීම් ඉටු කිරීමටත් ඔවුන්ට හැකියාව ඇත.

නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් සිය දෙනෙකු සිටී. නිරීක්ෂණ කාල පරිච්ඡේදය පුරාම සභාව වෙත යෝජනා ඉදිරිපත් කරන ලද්දේ ඉන් එක් අයෙක් පමණි. මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සභාපතිත්වය දරන්නේ සභිකවරියක්ය. නිරීක්ෂණයට ලක් කරන ලද පළාත් පාලන ආයතන අතුරින් එය එක් සුවිශේෂී ලක්ෂණයකි. සභාව වෙත යෝජනා ඉදිරිපත් කරමින් ඇය ඉතා සක්‍රිය ලෙස සභා කටයුතු වලට දායක වේ. පසුගිය කාලය තුළ සභා කටයුතු කළමනාකරණය කිරීමේදී ඇය විවිධ අභියෝගයන්ට මුහුණ දී තිබුණද කොමසාරිස්වරයා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ඇයට සහාය වී තිබුණි. කාන්තා සහයෝගීතා සංසදය විසින් සිය සොයාගැනීම් පිළිබඳ සාකච්ඡා කිරීමට සහ ගැටළු වලට විසඳුම් සොයා ගැනීම සඳහා සියළු සභාපතිවරුන්/වරියන් සාකච්ඡාවකට කැඳවා තිබුණද, ඊට සහභාගි වී තිබුණේ දෙදෙනෙකු පමණි. කරුණු මෙසේ තිබියදීත් පෙබරවාරි සහ මාර්තු දක්වා කාලය තුළ සභිකවරියන් කිසිදු යෝජනාවක් භාර දී නොතිබුණි.

හැටන්-දික්ඔය ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් සභා රැස්වීම් වල සිය අදහස් ඉදිරිපත් කරමින් කාලයෙන් නිසි ප්‍රයෝජනය ලබා ගනී.

අඹගමුව ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් කෝටා ක්‍රමය පිළිබඳව කතා කරමින් කියා සිටියේ සභාව තුළ කෝටාව නිසි පරිදි සම්පූර්ණ කොට නොමැති වීම හේතුවෙන් තවමත් එය පුරුෂාධිපත්‍යයට යට වී ඇති බවයි. 2019 ජනවාරි සහ පෙබරවාරි යන මාස තුලදී සභිකවරියන් සභා කටයුතු තුල නියැලෙමින් සිය අදහස් ඉදිරිපත් කොට ඇත. කෙසේ වෙතත් 2019 මාර්තු මාසය තුල සභිකවරියන්ගේ සහභාගිත්වය පැවතියේ පහළ මට්ටමකය.

**සභිකවරියන් ගැන සභිකවරුන් තුළ ඇති ආකල්ප**

ස්ත්‍රීන් දේශපාලනයේ නිරතවීම සම්බන්ධයෙන් සභාපතිවරයා ඇතුළු බොහෝ සභිකයින් තුළ පැවතියේ සෘණාත්මක මතයක් බව නිරීක්ෂිකාවන් විසින් වාර්තා කොට ඇත. පුරුෂ දේශපාලනඥයන් පවසන පරිදි ස්ත්‍රීන් දේශපාලනයට සුදුසු නැත. ඔවුන් දේශපාලනය තුළ නියැලීම හේතුවෙන් සභාව තුළ මෙන් ම ඔවුන්ගේ නිවෙස් තුළ ද විවිධ ගැටළු පැනනගින බව ඔවුන්ගේ අදහසයි. බොහෝ අවස්ථාවලදී ස්වකීය දේශපාලන පක්ෂයටම අයත් සභිකවරුන්ගෙන් සභිකවරියන්ට විවිධ අභියෝග එල්ල වේ. කෙසේ වෙතත්, සභිකවරියන්ට සිය සභිකවරුන් කිහිපදෙනෙකුගේ සහයෝගය ලැබේ.

මස්කෙලිය ප්‍රාදේශීය සභාව, කොටගල ප්‍රාදේශීය සභාව සහ හැටන් දික්ඔය නගර සභාව තුල සභිකවරියන්ට සිය අදහස් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන අතර ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගනු ලබයි. සභිකවරියන්ට සිය අදහස් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දුන්නද, ඔවුන් එම අවස්ථාවෙන් ඵලදායී ප්‍රයෝජනයක් ලබා ගන්නේ නැත. කොටගල ප්‍රාදේශීය සභාව තුළ සභිකවරියන් සිය අදහස් ඉදිරිපත් කොට ඇති අතර ඊට පිරිමි සභිකයන්ගේ සහාය ලැබෙන බව නිරීක්ෂිකාවන් විසින් වාර්තා ගතකර ඇත.

**අදාල පුහුණුවේ වැදගත්කම**

ස්ත්‍රීන්ට නාම යෝජනා ලබා දීමට පෙර ඔවුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය මූලාරම්භයන් සිදු කිරීමත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සිය අයවැය තුලින් මුදල් වෙන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමත් දේශපාලන පක්ෂ විසින් පියවර ගත යුතු බව නිරීක්ෂකයන් පෙන්වා දෙයි. සභා ක්‍රියාකාරකම් තුළ වඩා හොඳින් සහභාගි වීමට අවශ්‍ය විශ්වාසය පුහුණු කිරීම හරහා ඔවුන්ට ලැබෙන අතර ස්වාධීන ලෙස කටයුතු කිරීමටද එමගින් ඔවුන්ට උගන්වයි. විවිධ කුසලතා සහිත ස්ත්‍රීන් නායකත්ව තනතුරු වලදී නොසලකා හැරීම සිදු නොවන බවත් ඔවුන්ටම ඔවුන්ගේ කාර්යසාධනය තක්සේරු කිරීමට හැකියාව ලැබෙන බවත් එමගින් තහවුරු කෙරේ.

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

**සභා රැස්වීම්වලට සභිකවරියන් සම්බන්ධ වන ආකාරය**

අධ්‍යයන කාල පරිච්ඡේදය තුල සිදු කළ නිරීක්ෂණයන්ට අනුව බොහෝ සභිකවරියන්ට සභා කටයුතුවල නියැලීමට අවස්ථාව සලසා දෙන බව අනාවරණය වී ඇත. කෙසේ වෙතත්, ඇතැම් සභා තුළ ඔවුන්ගේ සහභාගිත්වය අසතුටුදායකය.

උප්පුවේලි ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් වලදී සිය අදහස් ප්‍රකාශ කිරීමට සභිකවරියන්ට අවස්ථාව ලබා දුන්නද ඔවුන් එයට එතරම් කැමැත්තක් දක්වන්නේ නැත. 2019 සැප්තැම්බර් මස පැවති රැස්වීමේදී අනාවරණය වූ කරුණක් වූයේ සභිකවරියන් බොහෝ විට එකට එක්ව කතා බහ කරමින් සිටිනු බවයි. එසේම ඇතැම් සභිකවරියන් සිය අදහස් ඉදිරිපත් කිරීමට මැලිකමක් දක්වන බවක් පෙනුණි. ත්‍රිකුණාමලය

නගර සභාවේ සභිකවරියන් සභා රැස්වීම් වලට සහභාගි වුවද, කිසිදු යෝජනාවක් ඉදිරිපත් කිරීමක් හෝ අනෙක් අය විසින් ඉදිරිපත් කරන ලද අදහස් පිළිබඳ අදහස් දැක්වීමක් ද සිදු කොට නොතිබුණි.

කින්නියා ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් තිදෙනාම සිය යෝජනා ඉදිරිපත් කොට සභා රැස්වීම් වලට දායකත්වය ලබා දී තිබුණි. කිසිදු විරෝධතාවයකින් තොරව ඔවුන්ගේ යෝජනා අනුමත කොට තිබුණි.

වැදගත් කරුණක් වන්නේ අනෙක් පලාත් වල පළාත් පාලන ආයතන සභිකවරියන් මෙන් නොව උතුරු පළාතේ සභා තුළ සිටින සභිකවරියන් සභා කටයුතු වල මූලිකත්වය ගෙන කටයුතු කිරීමයි. බොහෝ පිරිමි සභිකයන්ද එම සභිකවරියන් වෙතින් ආදර්ශයන් ලබා ගන්නා බව නිරීක්ෂිකාවන් ප්‍රකාශ කළේය. ඊට හේතුව වන්නේ එම සභිකවරියන් අතුරින් බොහෝ දෙනෙකු අත්දැකීම් ලත් දේශපාලන ක්‍රියාකාරීන් වීම විය හැකිය. නැගෙනහිර පළාතේ තත්ත්වය ඊට ප්‍රතිවිරුද්ධ වන අතර සියලුම සභාවල පිරිමින්ට වඩා ස්ත්‍රීන් දෙවන ස්ථානයට පත්ව සිටී.

**සභිකවරියන් පිළිබඳව සභිකවරුන්ගේ ආකල්පය**

කින්නියා ප්‍රාදේශීය සභාවේ සභිකවරියන් තිදෙනාටම අන්‍යයන්ගේ බාධා කිරීම් වලින් තොරව පළමුව සිය අදහස් ප්‍රකාශ කිරීමටත්, යෝජනා ඉදිරිපත් කිරීමටත් හැකි විය. සභිකවරියන් ඇතුළු සභාවේ සියළු දෙනාට සිය අදහස් ඉදිරිපත් කිරීමේ නිදහස තිබූ බව නිරීක්ෂණය කර තිබුණි. කරාචි ප්‍රාදේශිය සභාව සහ පූන්කාරි ප්‍රාදේශීය සභාව විසින් සභිකවරියන්ට සිය අදහස් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී තිබුණි.

**ස්ත්‍රීන්ගේ ගැටලු පිළිබඳ ඇති සංවේදිතාවය**

උතුරු හා නැගෙනහිර පළාත් තුළ ඇති පළාත් පාලන ආයතන ස්ත්‍රීන්ගේ ගැටළු වෙනුවෙන් වැඩි සංවේදිතාවයක් දක්වා තිබුණි.

**අරමුදල් සැපයීම**

අරමුදල් නොමැති වීම හේතුවෙන් ඇතැම් සභා වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන්නේ ප්‍රමුඛතා පදනමිනි.

# වෙනත් කරුණු

**භාෂාව**

අවධානය යොමු කළ යුතු තවත් කරුණක් වන්නේ භාෂාවයි. සිංහල, දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන් නියෝජනය කරනු ලබන සභිකයින් සිටින, සිංහල භාෂාවෙන් සභා කටයුතු කරගෙන යනු ලබන සභාවන් තුළ පරිවර්තන පහසුකම් තිබුණද දමිළ හා මුස්ලිම් සභිකයින් පූර්ණ වශයෙන් එම සාකච්ඡා අවබෝධ කරගන්නා බවට සහතිකයක් නොමැති බව නිරීක්ෂකයින් විසින් පෙන්වා දී ඇත. ඒ හේතුවෙන් ඔවුන්ට ඇතැම් කරුණු සම්බන්ධයෙන් වහාම ප්‍රතිචාර දැක්වීමට ඇති අවස්ථාව අහිමි වේ.

**කාර්යපටිපාටිය**

රැස්වීම් සාමාන්‍යයෙන් සිදු වන්නේ න්‍යාය පත්‍රයට අනුකූලවයි. සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා වූ මුදල් මූල්‍ය කමිටුව විසින් අනුමැතිය ලබා දීමෙන් අනතුරුව සම්මත කරනු ලබයි.

**කාර්ය සටහන් / වාර්තා**

රැස්වීම් පිළිබඳ වාර්තා ඊට දිනකට පෙර හෝ ඇතැම් විට එදිනම සභිකයින් වෙත ලබා දීම හේතුවෙන් ඔවුන්ට ඒවා අධ්‍යයනය කොට අවශ්‍ය වෙතොත් මැදිහත්වීම් සිදු කිරීමට ඇති අවස්ථාව අහිමි වේ. අධ්‍යයනයට ලක් කරන ලද සියළු සභාවන්ගෙන් පාහේ මතු වූ එක් ගැටළුවක් එයයි.

මෙම ගැටළුව විසඳීම සඳහා වූ ප්‍රයත්නයක් බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර, එහිදී ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය පිලිබඳ සිදු කරන ලද වැඩමුළුවේදී, අදාල වාර්තා සභිකයින් වෙත විද්‍යුත් තැපෑලෙන් (e-mail) යවන ලෙසට පුහුණුකරු නිර්දේශ කොට තිබුණි. 2019 ජනවාරි මස සිට මෙම පිළිවෙත ක්‍රියාවට නැංවීමට එකඟතාවය ඇති විය.

**න්‍යාය පත්‍රය**

සෑම සභාවකම රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයක් ඇත. ඇතැම් සභා විසින් එය පිළිපදින අතර ඇතැම් සභා ඊට අනුගත වීමට උත්සාහ දැරීය. නමුත් බොහෝ අවස්ථාවලදි සිදුවන්නේ සාකච්ඡාවන් තේමාවෙන් බැහැරව ගොස් සභාවට අදාල නොවන කරුණු සාකච්ඡා කිරීමයි. උදා : පක්ෂ දේශපාලනය හෝ ජාතික ගැටළු. එහිදී සැබැවින්ම සිදුවන්නේ අදාල ප්‍රදේශයේ ජනතාව විසින් මතු කරන ලද ගැටළු සාකච්ඡා කොට ඒවාට විසඳුම් සෙවීමට හෝ යෝජනාවක හොඳ නරක සාකච්ඡා කිරීමට ඉතා සුළු කාලයක් ලබා දීම හෝ ඒවා වෙනත් දිනයක් දක්වා කල් තැබීමයි.

පූර්ව මාසයේ සාකච්ඡා වල යම් යම් කොටස් වාර්තා තුලින් ඉවත් කොට තිබීම හේතුවෙන් රැස්වීම් වාර්තා සඳහා සංශෝධනයන් අවශ්‍ය කළ අවස්ථාවන් බොහෝ විය.

**කාලය වෙන් කිරීම**

සැලකිල්ල යොමු විය තවත් කරුණක් වන්නේ පිරිමි සභිකවරුන් තමන්ට වෙන් කර දී ඇති කාලයට වඩා වැඩි කාලයක් කතා කරමින් අනෙක් සභිකයන් හට සිය කරුණු ඉදිරිපත් කිරීමට ඇති අවස්ථාව අහිමි කිරීමයි. එවන් අවස්ථාවලදී විශේෂයෙන් පීඩාවට පත් වන්නේ සභිකවරියන්ය.

# අරමුදල් සැපයීම

අරමුදල් සඳහා වන ප්‍රවේශය සම්බන්ධයෙන් ගත් කළ, තම ප්‍රදේශ වල සංවර්ධන කටයුතු සඳහා මුදල් යෙදවිය හැකි මාර්ග ගණනාවක් සභිකවරියන් සතුව ඇති බව නිරීක්ෂණයන්හිදී අනාවරණය විය. එක්සත් ජාතික පක්ෂය (එ.ජා.ප) මූලික රජය විසින් ක්‍රියාත්මක කරන ලද 'ගම්පෙරලිය' සංවර්ධන සංග්‍රාමය යටතේ රුපියල් මිලියන 100 ක් එක් එක් කොට්ඨාශයට වෙන් කරනු ලැබීය. එම මුදල් බෙදා හරිනු ලැබුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාය. මෙම වැඩසටහන යටතේ වූ වැඩසටහන් බොහොමයක් ක්‍රියාවට නංවනු ලැබුවේ එ.ජා.ප සභිකයින් විසිනි. සෑම සභිකවරියකටම රුපියල් මිලියන 1 සිට 8 දක්වා මුදලක් වෙන් කරන ලදී.

මේ අතර, සිය 'රත්න මාතා' සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රී.ලං.නි.ප) විසින් ශ්‍රී ලං නි ප සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (ශ්‍රී.ලං.පො.පෙ) පුරුෂ හා කාන්තා සභිකයන් සඳහා රුපියල් 500,000 සිට මිලියන 2 දක්වා මුදලක් ලබා දෙන ලදී.

ආර්ථික කටයුතු අමාත්‍යාංශය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන්ගේ විමධ්‍යගත අයවැය හරහා කාන්තා සභිකයින් හට සිය සංවර්ධන කටයුතු සඳහා අරමුදල් ලැබුණි. ඊට අමතරව පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු.200,000 සිට 300,000 දක්වා මුදලක් සපයා දෙන ලදී .

වයඹ සංවර්ධන අමාත්‍යාංශය ආදී මධ්‍යම පළාතේ අමාත්‍යාංශ විසින් ග්‍රාමීය සංවර්ධන සහ විහාරස්ථාන ප්‍රතිසංස්කරණය වෙනුවෙන් (කුරුණෑගල දිස්ත්‍රික්කයේ සභා විසින් භාවිතා කළ හැකි පරිදි) රු 200,000 සිට 1,000,000 දක්වා මුදලක් ලබා දෙන ලදී. මෙකී සියළු මුදල් කාන්තා හා පුරුෂ යන සභික වර්ග දෙකටම ලබා දෙන ලදී .

තවත් ප්‍රශ්නකාරී කරුණක් වූයේ මැතිවරණ ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් එක් රැස්කිරීමේ දී තරඟකරුවන්ට වඩා තරඟකාරිනියන්ට සිය අරමුදල් එක් රැස් කර ගැනීමේ අපහසුතාවයන් පවතින බවයි. මෙම කරුණ පිළිබඳව දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් පමණක් නොව ඒ පිලිබඳව පාර්ලිමේන්තුව වෙත ලියා දැන්වීමටත් එක් ස්ත්‍රී කණ්ඩායමක් තීරණය කොට ඇත.

සභිකවරියන්ට සිය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොකරන හෝ සීමාසහිත ප්‍රතිපාදන වෙන් කිරීම පොදුවේ නිරීක්ෂ්‍ය කරන ලද කරුණක් විය. විශේෂයෙන් විරුද්ධ පක්‍ෂය නියෝජනය කරුනු ලබන සභිකවරියන් මෙම තත්ත්වයට මුහුණ දේ. එසේහ දේශපාලන පක්‍ෂ හරහා සපයා දෙනු ලබන අරමුදල් වලින් ස්ත්‍රීන්ගේ සංවර්ධන කටයුතු සඳහා වෙන්කරනු ලබන්නේ සීමිත සම්පත් ප්‍රමාණයකි. 2018 මාර්තු මස සිට ඇතැම් සභිකවරියන් දේශපාලන පක්‍ෂ වෙතින් කිසිදු මූල්‍ය ප්‍රතිපාදනයක් ලබා නොමැති බව නිරීක්ෂිකාවන් සඳහන් කරයි.

සභිකවරියන් ඉදිරිපත් කරනු ලබන යෝජනා සභා රැස්වීම් තුළ ඇතුළත් නොවන අවස්ථා තිබෙන අතර සංශෝධනයන් සිදු කරනු ලබන විට පවා ඒවා වාර්තා තුළට ඇතුලත් නොකරන බවද නිරීක්‍ෂණයේ දී අනාවරණය වී ඇත. ස්වකීය යෝජනා පිළිගෙන ක්‍රියාවට නැංවීමෙහිලා ස්ත්‍රීන් විවිධ අභියෝගවලට මුහුණ දෙන බව පැහැදිලි කරුණකි.

# අධ්‍යයනයේ අඩුපාඩු

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අත්විඳී අඩුපාඩු**

මින් පෙර ද සඳහන් කර ඇති පරිදි මෙම අධ්‍යයනයේ එක් අඩුපාඩුවක් වන්නේ සියළු වාර්තා ඉදිරිපත් කර නොතිබීමයි. උදාහරණයක් ලෙස ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වාර්තා එක් සභාවකට එකක් හෝ දෙකක් පමණක් වූ අතර තෝරාගත් සියළු සභා ආවරණය කොට නොතිබුණි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තෝරාගත් සභා නිරීක්ෂණය කිරීමට සභාව විසින් සහයෝගය ලබා නොදීම හේතුවෙන් අඩපණ විය. මෙම වාර්තාවේ මින් පෙර සඳහන් කර ඇති පරිදි නිරීක්ෂකයින්ට සභා රැස්වීම් නිරීක්ෂණය කිරීමට ඉඩ ලබා නොදුන් අතර 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව නිරීක්ෂණ කටයුතු නවතන ලෙසට දැනුම් දෙන ලදී. තවත් අවස්ථාවලදී අවසර ලිපිය ලැබුණේ රැස්වීම් දිනයේදී හෝ ලිපිය ඔවුන් වෙත තැපැල් කොට තිබුණේ එදිනය. ඒ හේතුවෙන් නිරීක්ෂකයන් හට අදාල දිනයේ සභා කටයුතු නිරීක්ෂණය කිරීම අපහසු විය. ඇතැම් සභා විසින් නිරීක්ෂකයන් හට දැනුම් දී තිබුණේ ඉදිරි දිනකදී නිරීක්ෂණ කටයුතු සිදු කළ හැකි බවයි.

**නුවරඑළිය දිස්ත්‍රික්කයේ අත්විඳී අඩුපාඩු**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉදිරිපත් කොට තිබූ වාර්තා 2018 දෙසැම්බර් මස සිට 2019 ඔක්තෝබර් දක්වා වූ කාලයේ ඒවා යි. එසේම සිව් වතාවක් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවට ගියද, නිරීක්ෂිකාවන්ට එම සභාව පිළිබඳ වාර්තා කිරීමට ඉඩ ලබා දුන්නේ නැත. එබැවින්, නිරීක්ෂිකාවන් විසින් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව නිරීක්ෂණය කිරීම නතර කොට ඒ වෙනුවට අඹගමුව ප්‍රාදේශීය සභාව නිරීක්ෂණය කළේය.

**බදුල්ල දිස්ත්‍රික්කයේ අත්විඳී අඩුපාඩු**

බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 4 ක් වෙතින් වාර්තා ලැබුණි. ලැබුණු හතර අතුරින් අධ්‍යයනය පුරාවටම ආවරණය කරන ලද්දේ බදුල්ල සහ පස්සර ප්‍රාදේශීය සභාය. හාලිඇල ප්‍රාදේශීය සභාවෙන් එක් වාර්තාවක් ලැබුණු අතර සොරණාතොට ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් හා දෙසැම්බර් වාර්තා සහ 2019 ජනවාරි, මාර්තු, අප්‍රේල් සහ ජුලි වාර්තා ඉදිරිපත් කොට තිබුණි.

බදුල්ල, හාලිඇල සහ පස්සර සභාවන්හි මහජන ගැලරි වල ඉඩකඩ ප්‍රමාණවත් නොවීය. සිදු කරන ලද ඇගයීම් පිළිබඳව කොමසාරිස්වරුන් සිය ප්‍රසාදය පල කොට සිටි අතර ඇතැම් සභා ඒ සඳහා සිය සහයෝගය ලබා නොදුන් බව සටහන් කළ යුතුය. නිරීක්ෂකයින් තිදෙනෙකු සිටි අවස්ථාවලදී පවා ඇතැම් සභා විසින් සපයා දී තිබුනේ මේස හා පුටු දෙකක් පමණි.

අනෙකුත් ගැටළුකාරී ක්ෂේත්‍රයන් වූයේ, වාර්තා තුළ සභිකයින්ගේ සංඛ්‍යාව තිබුණද (යම් දිනයක සහභාගි වන කාන්තාවන් හා පුරුෂයින් වෙන් වෙන්ව) එක් එක් සභාව අනුව සභිකයින්ගේ නිවැරදි සංඛ්‍යාව සඳහන් නොවීය. මෙම තොරතුරු ලබා ගනු ලැබුවේ අන්තර් ජාලයෙන් සහ මාධ්‍යයේ සහ පාර්ලිමේන්තුව වෙත ඉදිපරිත් කරනු ලැබූ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව ආදී මූලාශ්‍රයන් ගෙන්ය. එහිදීත් එක් එක් සභාව වෙත තේරී පත් වූ සභික සංඛ්‍යාව තිබුණද, ස්ත්‍රීන් සහ පුරුෂයින් අනුව වර්ගකිරීමක් නොතිබුණි.

එසේම කාන්තා සභිකයින් පළමු වතාවට පත් වූ අයද නොඑසේ නම් සභාවේ මින් පෙර නියෝජනය කළ අයද යන්න වාර්තාව තුළ නිශ්චිතව සඳහන්ව තිබුණේ නැත. පළමු වතාවට සභාවලට පත් වූ සභිකවරියන් සක්‍රිය ලෙස කටයුතු වලට සහභාගි වූයේද නොඑසේ නම් වැඩි දායකත්වයක් සපයනු ලැබුවේ අත්දැකීම්

සහිත පළපුරුදු සභිකවරියන්ද යන්න තීරණය කිරීම සඳහා එම තොරතුරු අපට ප්‍රයෝජනවත් වන්නට තිබුණි.

කොතරම් මුදලක් කිනම් දේ මත වියදම් කළාද යන්න පිළිබඳ නිශ්චිත තොරතුරු ඇතුළු ආදායම් හා වියදම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතැම් වාර්තා තුළ අන්තර්ගත වූ අතර අනෙක් වාර්තා තුළ ඇතුලත් වූයේ ආදායම් හා වියදම් පමණි. එසේම තවත් වාර්තා තුළ මුදල් පිලිබඳ කිසිදු සඳහනක් නොවීය.

# නිර්දේශ

***දේශපාලන පක්ෂ වෙත***

- මුහුණ දීමට සිදුවූ අභියෝග හමුවේ වුවත්, තමන් නියෝජනය කරන බල ප්‍රදේශ වල සංවර්ධනය *සහ වැඩිදියුණුව වෙනුවෙන් තමන්ට සාධනීය කාර්යභාරයක් ඉටු කළ හැකි බව සභිකවරියන් විසින් ඔප්පු කර ඇත. එබැවින්, පළාත් පාලන ආයතනවල ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කරන ලද අනිවාර්ය කෝටාව, අඛණ්ඩව ඉදිරියටත් පවත්වාගෙන යන බවට දේශපාලන පක්ෂ විසින් වග බලා ගත යුතුය. එසේම පළාත් සභා සහ පාර්ලිමේන්තු මැතිවරණ සඳහාත් එවන් පංගු ක්‍රමයක් හඳුන්වා දීම සඳහා දේශපාලන පක්ෂ සක්‍රියව උනන්දු විය යුතුය.*

- *දේශපාලනයට ඇතුලු වන ස්ත්‍රීන් සම්බන්ධයෙන් සෘණාත්මක ආකල්පයක් පවතින බව නිරීක්ෂකයින්* විසින් නිරීක්ෂණය කොට ඇත. එබැවින් පක්ෂයේ තීරණ ගැනීමේ මට්ටම්වල ව්‍යුහයන් තුළ සිටින පුද්ගලයින් විසින් විශේෂ මාර්ගෝපදේශයන් සකස් කොට ඒවා පළාත් පාලන ආයතන වල සියළු සභිකයින්ට ලබා දිය යුතු අතර, පළාත් පාලන ආයතන තුළ සිටින සභිකවරියන්ට සහ සභිකවරුන්ට එක හා සමාන ලෙස සැලකිය යුතු බවත් වෙනස්කොට සැලකීමකින් තොරව සෑමට සමාන ලෙස ගෞරව කළ යුතු බවත් ඒ තුළ අවධාරණයට ලක් කළ යුතුය.

- දේශපාලන පක්ෂ තුළ තීරණ ගැනීමේ මට්ටම්වල සිටින්නේ ස්ත්‍රීන් ඉතා අල්ප සංඛ්‍යාවකි. එබැවින් සභිකවරියන්ට දේශපාලන පක්ෂයේ තීරණ ගැනීමේ ව්‍යුහයන් තුලට ප්‍රවේශ විය හැකි තත්ත්වයක් නිර්මාණය කළ යුතු අතර එවිට ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කොට සලකන සුළු ආකල්ප තුරන් කළ හැකිය.

- පුරුෂයින් සහ ස්ත්‍රීන් අතර පමණක් නොව දේශපාලන පක්ෂ තුළ පවා අරමුදල් සමාන ලෙස බෙදී නොයාම දක්නට ලැබේ. එබැවින් පක්ෂය වෙනුවෙන් බිම් මට්ටමේ කටයුතු කරන ස්ත්‍රීන් සඳහා ප්‍රමාණවත් අරමුදල් සපයා දිය යුතුය. මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරුන් වෙත ලබා දෙන මුදල් වෙන් වෙනස්කොට සැලකීමෙන් හෝ විශේෂ සැලකිල්ලකින් තොරව වියදම් කරන බවට තහවුරු කර ගැනීම සඳහා වූ නිසි අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය.

- ඒ හා සමානවම ස්ත්‍රීන්ගේ දේශපාලන කටයුතු සඳහා පක්ෂ විසින් පොදු අරමුදලක් ස්ථාපිත කළ යුතුය.

- ස්වකීය වැඩකටයුතු ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පළාත් පාලන ඇයතනවල සියලු සභිකයන් සහ විශේෂයෙන් නවක සභිකයන් සඳහා පුහුණුව සහ මගපෙන්වීම සපයා දිය යුතුය. පුහුණුව ලද කාන්තා සභිකයන් වඩාත් දක්‍ෂ අයුරින් සිය කටයුතුවල නියැලෙන බව නිරීක්ෂණය කරන ලදී. මූලික වශයෙන් පළාත් පාලන කටයුතු තුල ස්ත්‍රීන්ගේ සහභාගිත්වය සතුටුදායක මට්ටමක නොතිබුණද පුහුණු සහ මාර්ගොපදේශයන් නිසා ඔවුන් සැලකිය යුතු දියුණුවක් ප්‍රදර්ශනය කොට ඇත. එබැවින් අදාල දේශපාලන පක්ෂ සහ රාජ්‍ය ආයතන විසින් ස්ත්‍රීන් හා පුරුෂ යන සභික කාණ්ඩ දෙක සඳහාම පළාත් පාලනය පිළිබඳ දැනුම සහ පළාත් පාලන ආයතන වල ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණුව ලබා දිය යුතුය.

- බොහෝ සභා තුළ නිරීක්ෂණයට හසු වූ කාරණයක් වූයේ ස්ත්‍රී සහ පුරුෂ යන සභික කාණ්ඩ දෙක විසින්ම සියළු චර්යා සම්මතයන් නොසලකා හරිමින් ප්‍රමාද වී පැමිණීම, රැස්වීම කඩාකප්පල් කිරීම හෝ සාකච්ඡා තුළ සක්‍රීය ලෙස සහභාගි නොවීම ආදියයි. එබැවින් සභා නිලධාරීන් සමග එක්ව සියළු දේශපාලන පක්ෂ විසින් රැස්වීම් පැවැත්වෙන අවස්ථාවන්හිදී පිලිපැදිය යුතු චර්යාවන් පිළිබඳ මාර්ගෝපදේශයන් සකස් කළ යුතු අතර සියළු සාමාකජියන් විසින් ගෞරවනීය චර්යාවන් ප්‍රදර්ශනය කරනු ලබන බවට වග බලා ගත යුතුය.

- සභිකයින් අතර මෙන්ම ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුල පවා සභා විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සංවේදීතාවය ප්‍රදර්ශනය නොකිරීම දක්නට ලැබුණි. එබැවින් පක්ෂ ක්‍රියාකාරකම් සඳහා සහභාගි වන පුරුෂයන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදී ආචාර ධර්ම පද්ධතියක් සකස් කොට එය බලාත්මක කළ යුතුය.

- පොදුවේ සමාජය තුළ ජීවත්වන ස්ත්‍රීන් මුහුණ දෙනු ලබන ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා වෙනත් ස්ත්‍රී පුරුෂ සමාජ සම්බන්ධතාවේදී ඔවුන් දිරිමත් කළයුතුය. ජාත්‍යන්තර ස්ත්‍රී දිනය, ස්ත්‍රී අයිතිවාසිකම් සහ සවිබල ගැන්වීම් කෙරෙහි ක්‍රියාකාරිත්වය ආදී ස්ත්‍රීන් සඳහා සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා ඔවුන් විසින් වැඩි ක්‍රියාකාරිත්වයක් ලබාදිය යුතුය.

- සභාවේ කාරක සභාවක් ලෙස ස්ත්‍රීන්ගේ කාරක සභාව අනිවාර්ය කළ යුතුය.

- ද්වේශ සහගත ප්‍රකාශවලටත් ලිංගික අනුම්පද කීම් වලටත් විශේෂයෙන් කාන්තාවන් මුහුණ දෙයි. ස්ත්‍රීන්ට දේශපාලනයට පිවිස ගෞරවාන්විත ලෙස දේශපාලනය තුළ නියැලීම සඳහා අයිතිය ආරක්ෂා කර ගනු ලබන ස්ත්‍රීන් සංවර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකාවේ සියලු දේශපාලන පක්ෂ කටයුතු කළ යුතුය. ලිංගික හෝ කාන්තාවන්ට හිංසනයන් සිදුවන ආකාරයේ චර්යාවන් ප්‍රදර්ශනය කරනු ලබන පුද්ගලයන්ට දඬුවම් ලබාදිය යුතුය.

- විශේෂයෙන් ස්ත්‍රීන් ද්වේශ සහගත සහ ලිංගික ඇණුම්පද වල වින්දිතයන් බවට පත් වේ. එබැවින් ස්ත්‍රීන්ට දේශපාලනයට පිවිස ගෞරවනීය ලෙස සිය දේශපාලන ජීවිතය ගත කිරීමට හැකි වන පරිදි ස්ත්‍රී අයිතිවාසිකම් සුරකින දේශපාලන සංස්කෘතියක් බිහි කිරීමට ශ්‍රී ලංකාවේ සියළු දේශපාලන පක්ෂ උත්සුඛ විය යුතුය.

- සිය පවුල් වල කටයුතු වලට සහභාගි වන අතරතුර සිය නිලයේ වගකීම් ඉටු කිරීමේදී සහ පක්ෂ ක්‍රියාකාරකම් තුළ පූර්ණ වශයෙන් සහභාගි වීමේදී ස්ත්‍රීන් මුහුණ දෙනු ලබන විවිධ ගැටළු නිරීක්ෂණයේදී අනාවරණය විය. එබැවින් ස්ත්‍රීන්ට රාජකාරි සහ පවුල් ජීවිතය අතර තුලනයක් පවත්වා ගෙන යා හැකි වන පරිදි ස්ත්‍රීන් සමග සාකච්ඡා කොට දේශපාලන පක්ෂ විසින් ඊට විසඳුම් සෙවිය යුතුය.

- පාසල් නිවාඩු කාලය තුළදී සිය දරුවන් සහා රැස්වීම් වෙත ගෙන ඒමට සිදුවන ගැටළුව ස්ත්‍රීන් විසින් මතු කරන ලදී. ස්ත්‍රීන් සිය සභා කටයුතු වලට සහභාගි වන අතරතුර ඔවුන්ගේ දරුවන් සඳහා සුදුසු විකල්ප රැකවරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.

- ස්ත්‍රීන්ට රාත්‍රියේදී රාජකාරි වැඩ කිරීමට අවශ්‍ය වන ආරක්ෂාව පිලිබඳ ගැටළුවක් හඳුනාගෙන ඇත. දේශපාලන පක්ෂ විසින් සක්‍රියව මැදිහත්ව පළාත් පාලන ආයතන නිලධාරීන් සමග එක්ව රාත්‍රී රාජකාරි වල නියැලෙන ස්ත්‍රීන් ආරක්ෂාකාරී ලෙස සිය නිවස කරා ගෙන යනු ලබන ප්‍රවාහන පහසුකම් සැලසුම් කළ යුතුය.

- 2017 අංක 16 දරණ පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත සහ සභාවේ කාර්යයන් හා සම්බන්ධ ගැසට් පත්‍ර පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති බව නිරීක්ෂණය කරන ලදී මේ සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළයුතුය.

**මහජනතාව සහ සමාජ සංවිධාන වෙත**

- ස්ත්‍රීන් දේශපාලනයට පිවිසීම පිළිබඳව සීමාසහිත අවබෝධයක් සහ / හෝ ඍණාත්මක ආකල්පයක් පවතින බව පෙනේ. එබැවින් දේශපාලනය තුළ සිටින ස්ත්‍රීන්ගේ සුභවාදී පැතිකඩයන් පිලිබඳ දැනුම ඉහළ දැමීමේ ප්‍රධාන භූමිකාවක් සමාජ ක්‍රියාකාරීන් විසින් ඉටු කළ යුතුය. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජ සහ ප්‍රජා සංවිධාන සහ මාධ්‍යය භාවිතා කළ හැකිය.

- ඉතා වෙහෙස මහන්සි වී හා දැඩි කැපවීමෙන් යුතුව කටයුතු කිරීම තුලින් දිනාගත් ස්ත්‍රීන් සඳහා වූ 25% කෝටාව ආරක්ෂා කිරීම සහ එය පළාත් සභා සහ පාර්ලිමේන්තුව දක්වාත් ව්‍යාප්ත කිරීම සියළු පුරවැසියන්ගේ වගකීමකි. එබැවින් සියලු දේශපාලන ව්‍යුහයන් තුළ සිටින ස්ත්‍රීන් සඳහා ස්ථාන ඉඩ

ප්‍රස්ථා ප්‍රවර්ධනය කිරීම පිණිස වූ නීති සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය උද්දේශණ කටයුතු පෙරට ගෙන ඒමෙහිලා මහජනතාව සහ සමාජ සංවිධාන යුහුසුලුව කටයුතු කළ යුතුය.

- දැනුම සහ කුසලතා පුහුණුව ලැබීමෙන් අනතුරුව ස්ත්‍රීන් සභා ක්‍රියාකාරකම් තුල ඉතා සක්‍රිය ලෙස සහභාගි වන බව අධ්‍යයනය විසින් පෙන්වා දෙයි. එම පුහුණුවලින් සමහරක් ලබා දී ඇත්තේ ප්‍රජා සංවිධාන විසිනි. කෙසේ වෙතත් මෙම පුහුණු අනන්‍යතාවය මත පදනම් විය යුතු අතර ඒවායේ ඵලදායීතාව තක්සේරු කළ යුතුය. එසේම ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී විය යුතු අතර පිළිගත් සම්මතයන්ට අනුව සකස් කළ යුතුය.
- මහජන සහ සිවිල් සමාජ සංවිධාන විසින් අඛණ්ඩව පළාත් පාලන ආයතන නිරීක්ෂණයට ලක් කළයුතුය අවශ්‍යතාවයන් වෙත සභා මෙහෙයවීමටත් මහජන සුබසිද්ධිය වෙනුවෙන් සභා ක්‍රියාවලී පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබාගැනීමටත් මහජනතාවට එසේ අවස්ථාව උදා වේ. ස්ත්‍රී සහ පුරුෂ සභිකයන්ගේ ධාරිතාවයන් වඩා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට සිවිල් සමාජ සංවිධාන සහ විශේෂ වශයෙන් ස්ත්‍රී සංවිධානවලට හැකිය.
- එවැනි පුහුණු තමන්ටද ලබා දෙන ලෙස තවත් ස්ත්‍රීන් වෙතින් ඉල්ලීම් ලැබී ඇත. එබැවින් පළාත් පාලන ආයතන වලට තේරී පත්ව සිටින ස්ත්‍රීන් සහ දේශපාලනයට අවතීර්ණ වීමට අපේක්ෂාවෙන් පසුවන ස්ත්‍රීන් සඳහා ඔවුන්ගේ දැනුම, කුසලතා සංවර්ධනය සහ පුහුණුව සඳහා වැඩිදුර ඉඩ ප්‍රස්ථා සමාජ සංවිධාන විසින් සැපයිය යුතුය.

**මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන් වෙත**

- සභිකවරියන් විසින් ඉටු කරනු ලබන වැඩ කටයුතු වලට නිසි මාධ්‍ය ආවරණයක් නොලැබෙන බව නිරීක්ෂණය විය. එබැවින් පළාත් පාලන ආයතන තුල සිටින ස්ත්‍රීන්ගේ ශක්තීන් සහ ක්‍රියාකාරකම් ඉස්මතු කරවීම සඳහා මාධ්‍යය තුල ප්‍රමාණවත් ඉඩක් වෙන් කර දීමට මාධ්‍ය වෘත්තිකයන් සහ සංවිධාන අවංක ප්‍රයත්නයක් දැරිය යුතුය. අන්තර්කරණ දේශපාලන සබඳතාවක් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීමට මෙන්ම සදාචාර සම්පන්න සහ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමටද මෙය උපකාරී වේ.
- දේශපාලනය තුළ නිරත ස්ත්‍රීන් පිළිබඳ සාකච්ඡාව අඛණ්ඩව ඉදිරියට ගමන් කරන එකක් මිස මැතිවරණයක් කැඳවූ අවස්ථාවට පමණක් සීමා වූ එකක් නොවේ. එබැවින් ගුවන් විදුලි මාධ්‍ය තුළ සාකච්ඡා, දේශපාලනයේ යෙදී සිටින ස්ත්‍රීන් පිළිබඳ ලිපි, පංගු ක්‍රමයේ වැදගත්කම, අඩුපාඩු ආමන්ත්‍රණය කිරීම සඳහා වන ක්‍රමවේද සෑම අවස්ථාවකදීම සම්මතය විය යුතු අතර එය මැතිවරණ කාලසීමාවට පමණක් සීමා නොවිය යුතුය. එවන් ක්‍රියාකාරීත්වයන් මගින් දේශපාලනය තුළ සිටින ස්ත්‍රීන් සඳහා මැතිවරණ කොට්ඨාශය වඩා විවෘත බව තහවුරු කරන අතර කාන්තාවන් දේශපාලනය තුළ ක්‍රියාත්මක වීම සඳහා වඩාත් විවෘත මැතිවරණ කොට්ඨාශයක් නිර්මාණය කිරීම එවන් ක්‍රියාවන් එසේ තහවුරු කරනු ඇත.විශේෂයෙන් පුරුෂයින් විසින් දරන සෘණාත්මක ආකල්ප බැහැර කිරීමටද උපකාරී වේ. එසේම මැතිවරණයන්ට පෙර වඩා යහපත් පසුබිමක් නිර්මාණය කිරීමට මෙන්ම තීරණ ගැනීමේ තනතුරු වලට වැඩි ස්ත්‍රීන් සංඛ්‍යාවක් සඳහා කාන්තාවන්ට ජන්දය ලබා දී වැඩි වැඩියෙන් කාන්තාවන් පත්කරන්න. ඉඩ ප්‍රස්ථා ලබා දීමට ද ඊට හැකිය.

Women and Media Collective
Established 1984

Norwegian Embassy
*Colombo*